# 5. ආර්ථික හා සමාජ පොදු කාර්ය පිරිවැය

## 5.1 සමස්ත නිරීක්ෂණ

බල ශක්තිය, විදුලි සංදේශ සේවා, වාරිමාර්ග, ප්‍රවාහන පද්ධතිය, වරාය සහ ගුවන් තොටුපළ, ජල සම්පාදනය, සනීපාරක්ෂාව සහ කැළි කසල ඉවත් කිරීම, අපද්‍රව්‍ය එකතු කිරීම හා බැහැර කිරීම, ජලාපවහනය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය ආදී සියළුම ආර්ථික හා සමාජීය පොදු කාර්ය ශීර්ෂයන් "යටිතල ව්‍යුහය" නම් වූ තනි අයිතමයක් යටතේ ආවරණය කෙරේ. ආර්ථික වෘද්ධිය සහ ශුභසාධනය කඩිනම් කිරීමෙහිලා ශක්තිමත් සහ කාර්යක්ෂම යටිතල ව්‍යුහයක් තිබීම පූර්ව අවශ්‍යතාවයක් වේ. සම්පත් ලබා ගැනීමේදී රාජ්‍ය අංශය සතු සම්පත් වල සීමිත බව සලකා, ඉදිරි පස් වසර තුළ නවීන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙහි අවශ්‍යතාවය 1995 අයවැය තුළින් අවධාරණය කෙරුණි. 1995 අයවැයෙන්, යටිතල ව්‍යුහය මත වූ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 51 දක්වා, ද.දේ.නි. යෙන් සියයට 7.7 කට සමාන ප්‍රමාණයකට ඉහළ නැංවීමට අපේක්ෂා කලේය. සම්පත් ලබා ගැනීමේදී පැවති සීමාවන් මෙන්ම, පරිපාලනමය හේතු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් නිසා පැන නැගුනු ඌන වියදම් හේතුවෙන් මෙම ඉලක්කයන් සපුරා ගත නොහැකි විය. කෙසේ වෙතත්, 1994 හා සසඳන කල 1995 දී යටිතල ව්‍යුහ පහසුකම් සඳහා වූ රාජ්‍ය ආයෝජනය රුපියල් වටිනාකම අනුව රුපියල් බිලියන 44 දක්වා සියයට 18 කින් වැඩි වූ අතර ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.6 ක් දක්වා වර්ධනය විය.

**5.1 සංඛ්‍යා සටහන**

**යටිතල ව්‍යුහ සඳහා වූ රාජ්‍ය ආයෝජන**

| | ආර්ථික සේවා | | සමාජ සේවා | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ද.දේ.නි. % | රුපියල් බිලියන | ද.දේ.නි. % | රුපියල් බිලියන | ද.දේ.නි. % |
| 1991 | 26.0 | 7.0 | 3.0 | 0.8 | 29.0 | 7.8 |
| 1992 | 20.4 | 4.8 | 6.1 | 1.4 | 26.5 | 6.2 |
| 1993 | 29.6 | 5.9 | 6.1 | 1.2 | 35.7 | 7.1 |
| 1994 | 29.3 | 5.1 | 7.7 | 1.3 | 37.0 | 6.4 |
| 1995 | 33.7 | 5.1 | 9.9 | 1.5 | 43.6 | 6.6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1995 දී ආර්ථික යටිතල ව්‍යුහය සඳහා කළ ආයෝජන රුපියල් බිලියන 34 ක් දක්වා වැඩි වූ අතර ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් එය සියයට 5.1 ක මට්ටමේම නොවෙනස්ව පැවතුණි. යටිතල ව්‍යුහ සංවර්ධනය උදෙසා පෙර වසර වලදී දැඩි අවධානයක් පෙන්නුම් කළද, යටිතල පහසුකම් සැපයුම, ඒ සඳහා වර්ධනය වෙමින් පවත්නා ඉල්ලුම සපුරාලීමට සමත් නොවීය. මෑත අතීතයේදී, විදුලිබලය සඳහා වූ ඉල්ලුම සියයට 10 කින් අඛණ්ඩව වර්ධනය වුවද, 1992 න් පසුව විදුලිය උත්පාදන ධාරිතාවේ පුළුල්වීමක් සිදු නොවීය. දුරකථන සඳහා වූ ඉල්ලුම සියයට 21 කින් වර්ධනය වූ අතර 1995 වර්ෂය අවසානයේදී සපුරාගනු ලැබුවේ මුළු දුරකථන ඉල්ලුමෙන් සියයට 46 ක් පමණි. වර්ධනය වෙමින් පවත්නා ප්‍රවාහන සේවා ඉල්ලුමද ප්‍රමාණවත් අයුරින් සපුරාලනු නොලැබිණ. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රවාහන පද්ධතියෙහි ප්‍රමාණවත් නොවූ ප්‍රසාරණය සහ මාර්ග පද්ධතියෙහි අයහපත් තත්ත්වයයි. සමාජීය ප්‍රගතිය සහ මානව සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන්හි දියුණුවට දැඩි ලෙස ඉවහල් වන ආර්ථික ප්‍රසාරණයට ඉඩ ප්‍රස්ථා සලසනු පිණිස මෙම අවහිරතා අප්‍රමාදව ඉවත් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි.

සමාජ යටිතල ව්‍යුහය සඳහා වූ රජයේ ආයෝජනය 1995 දී ද.දේ.නි. න් සියයට 1.5 දක්වා හෙවත් රුපියල් බිලියන 10 දක්වා ඉහළ නැගුණේය. ක්‍රමයෙන් පහත වැටෙමින් පවත්නා සෞඛ්‍ය සේවා තත්ත්වය, සෞඛ්‍ය සහ අධ්‍යාපනික පහසුකම් ලබා ගැනීමේදී ඇති ප්‍රාදේශීය විෂමතා, වෛද්‍ය නිලධාරි හිඟය, ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනයේ ගුණාත්මක බව පහත් මට්ටමක පැවතීම ආදිය 1995 වසරේදී සමාජ යටිතල ව්‍යුහ ක්ෂේත්‍රය තුළ මුහුණ දුන් ඇතැම් ගැටළු විය. දුගී ජන කොටස් පමණක් ආවරණය වන පරිදි, තනි ඉලක්ක කළ වැඩපිළිවෙලක් යටතේ ශුභසාධන වියදම් විධිමත් කිරීම සඳහා සමෘද්ධි නමින් වූ දුගී බව පිටුදැකීමේ නව වැඩපිළිවෙලක් 1995 දී හඳුන්වා දෙනු ලැබිණි. මේ හා සමගම අනෙකුත් ශුභසාධන වැඩපිළිවෙළ එනම් ආහාර සහ භූමිතෙල් මුද්දර වැඩපිළිවෙල, පාසැල් සිසුන් සඳහා දිවා ආහාර වැඩපිළිවෙල, ජනසවිය වැඩ පිළිවෙල ආදිය අහෝසි විය.

## 5.2 සෞඛ්‍ය

සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග වැළැක්වීම සහ දැනට පවත්නා රෝග නිවාරණ සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම 1995 වර්ෂයේදී, සෞඛ්‍ය ප්‍රතිපත්ති මගින් අරමුණු කෙරිණි. ප්‍රාදේශීය මට්ටමේ සෞඛ්‍ය සේවාවන් වැඩි දියුණු කිරීම, අඩු වරප්‍රසාද ලබන, වඩා දුගී ජන කොටස් සඳහා සෞඛ්‍ය සේවා සැපයීම ඉලක්ක කිරීම, සෞඛ්‍ය සේවා සැපයීම් ක්‍රමයෙහි පවත්නා ග්‍රාමීය නාගරික විෂමතා අඩුකිරීම, මේ සඳහා අනුගමනය කළ ප්‍රධාන උපාය මාර්ග විය. මැලේරියා සහ අනෙකුත් බෝවන රෝග මර්ධනය, ළමා මන්දපෝෂණය දුරලීම විශේෂ ප්‍රමුඛස්ථ ක්ෂේත්‍ර විය. ප්‍රතිපත්ති සම්බන්ධිකරණය, ක්‍රියාත්මක කිරීම සහ සෞඛ්‍ය සංවර්ධනය අධීක්ෂණය කිරීම යන කටයුතුවලදී ජාතික සෞඛ්‍ය සභාව සහ ජාතික සෞඛ්‍ය සංවර්ධන කමිටුව සහභාගි විය.

1995 දී, සෞඛ්‍ය අංශය සඳහා වූ රජයේ මුළු වියදම සියයට 19 කින් ඉහළ ගොස් රුපියල් බිලියන 11 ක් විය. මෙම වැඩිවීමෙන් සියයට 65 ක් පමණ ප්‍රාග්ධන නඩත්තු කටයුතු සඳහා වූ අතර, ඉතිරිය නව ප්‍රාග්ධන ආයෝජන සඳහා විය. සෞඛ්‍ය සඳහා වූ වියදම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් 1994 දී වූ සියයට 1.6 සිට 1995 දී සියයට 1.7 දක්වා වැඩි විය. මෙයට සමානව, රාජ්‍ය වියදමෙහි සෞඛ්‍ය සේවා වියදම් කොටස 1994 සහ 1995 දෙවසර තුළදී සියයට 5.6 දක්වා සුළු වශයෙන් වැඩි විය. සෞඛ්‍ය අංශයේ යටිතල ව්‍යුහ පහසුකම් නඩත්තු කිරීම වැදගත් වනවා මෙන්ම, අනාගතයේදී වඩා නවීන සෞඛ්‍ය සේවාවන් සැපයීම සඳහා මෙම අංශය තුළ ප්‍රමාණවත් පහසුකම් සහ මානව සම්පත් ඇති බවට සහතික කරලනු පිණිස, සෞඛ්‍ය අංශ තුළ සම්පත් බෙදා හැරීමේදී යෝග්‍ය සම්මිශ්‍රණයක් පැවැතීමද අවශ්‍ය වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, වසරක් පාසා, දශලක්ෂ 3 කටත් අධික නේවාසික රෝගීන් සංඛ්‍යාවකටද, දශලක්ෂ 36 ක් පමණ බාහිර රෝගීන්ටද, රජයේ ආරෝග්‍යශාලා 510 කදී

**විශේෂ සටහන 2**

## ආර්ථික යටිතල ව්‍යුහ සංවර්ධනයේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය

කාර්යක්ෂම සහ විශ්වාසනියත්වයෙන් යුතු ආර්ථික යටිතල ව්‍යුහයක් (බලශක්තිය, විදුලි සංදේශ සේවා, ගමනාගමනය, වරාය සහ ජලසම්පාදනය හා අපද්‍රව්‍ය බැහැර කිරීම ආදියෙන් සමන්විත) කරුණු කීපයක් නිසා අත්‍යවශ්‍ය වේ. නිෂ්පාදන වියදම් පහත හෙලීම, ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, අනෙකුත් ක්ෂේත්‍රයන්ට අවශ්‍ය ආයෝජන ආකර්ශනය කිරීම, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සහ සුභසාධනය වැඩිදියුණු කිරීම මේ අතරින් ප්‍රමුඛ වේ.

මෑතක්වන තෙක්ම ප්‍රධාන යටිතල ව්‍යුහ සේවාවන් ක්‍රියාත්මක කරනු ලැබුයේ රජයට සම්බන්ධ ආයතන විසිනි. යටිතල ව්‍යුහ සේවා බොහෝමයක්ම පෞද්ගලික භාණ්ඩ ගණයට අයත් වුවද, යටිතල ව්‍යුහ ආයෝජන හා බැඳුනු අධිකතර පිරිවැය මෙන්ම ඒවායෙහි අනෙකුත් ආර්ථික හා සමාජීය බලපෑම් සැලකිල්ලට ගෙන මෙම ක්ෂේත්‍රයෙහි රාජ්‍ය අංශය ප්‍රමුඛව ක්‍රියා කර ඇත. කෙසේවුවද, විශේෂයෙන් මිල ප්‍රතිපත්ති හා අදාළ තීරණවලට එළඹීමේදී මෙම ආයතනවල අඩු ස්වාධීනත්වය සහ පරිපාලනමය අකාර්යක්ෂමතා නිසා නව ආයෝජන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් අතිරික්තයක් ජනිත කිරීමට ඒවා අපොහොසත් විය. මෙම ආයතන දැඩි මූල්‍යමය දුෂ්කරතාවලට මැදිවුනු අතර, ඒවායේ ඇතැම් මෙහෙයුම් පිරිවැය පියවා ගැනීමට පවා විශාල වශයෙන් රාජ්‍ය අයවැය පිහිට පැතීමට සිදුවිය. ඉකුත් දශක දෙක තුළදී මහා මාර්ග, ප්‍රවාහණ සේවා, විදුලිය බලය සහ තැපැල් සේවා අංශයන්හි සිදු කළ පෞද්ගලීකරණ කටයුතු ඇතුළත් ආර්ථික නිදහස් කරන ක්‍රියාමාර්ග හේතුකොට ගෙන යටිතල ව්‍යුහ පහසුකම් සපයන රාජ්‍ය ආයතන වෙත ලබාදුන් වර්තන පැවරුම්, මුළු වර්තන වියදමින් 1980 දී සියයට 4.8 සිට 1995 දී සියයට 1.6 දක්වා අඩුවිය. කෙසේවුවද, තවදුරටත් වැඩිදියුණු කිරීමේ සහ පුළුල් කිරීමේ දැඩි අවශ්‍යතාවයකින් පෙළෙන, ආර්ථික යටිතල ව්‍යුහ පහසුකම්වල වත්මන් තත්ත්වය මෙයින් පිළිබිඹු නොවේ. ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය පෙරටුකරගත් ආර්ථික වර්ධනයේදී ප්‍රමානවත් නොවන යටිතල ව්‍යුහ පහසුකම් දැඩි බාධකයක්ව පවතී.

දිගුකාලීන විදේශ අරමුදල් හිඟකම් සහ සීමාකාරී අයවැය තත්ත්වය යටතේ, යටිතල ව්‍යුහ සඳහා වූ රාජ්‍ය ආයෝජන මෑත කාලයේදී දැඩි ලෙස සීමා විය. ඉකුත් පස් වසර තුළදී ප්‍රවාහනය, විදුලි සංදේශ සේවා, විදුලිය බලය සහ ජලසම්පාදනය වැනි ප්‍රධාන ආර්ථික යටිතල ව්‍යුහ පහසුකම් සඳහා වූ මුළු රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4කට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙය ඉන්දුනීසියාව (සියයට 5 සිට 6 දක්වා), තායිලන්තය (සියයට 6 සිට 6.5 දක්වා), පිලිපීනය (සියයට 7) සහ මැලේසියාව (සියයට 5 සිට 8 දක්වා) යන රටවලට වඩා බෙහෙවින්ම අඩු මට්ටමක පවතී.[1] මේ අතර, මූලික යටිතල ව්‍යුහ සේවාවන් සඳහා වූ ඉල්ලුම 1989 න් පසුව සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර මෙම ක්ෂේත්‍රයන්ගෙන් වැඩි ප්‍රමාණයක නව ආයෝජන හිඟ විය. නිදසුනක් වශයෙන් විදුලිය බලය සඳහා වූ ඉල්ලුම වාර්ෂිකව සියයට 10 කින් වර්ධනය වූ නමුදු විදුලියබල ස්ථාපිත ධාරිතාව පසුගිය තෙවසර තුළ නොවෙනස්ව පැවතුණි. දුරකථන සඳහා වූ ඉල්ලුම සියයට 21ක සාමාන්‍ය වර්ධන අනුපාතිකයකින් වැඩි වුවද, 1995 වර්ෂය අවසානයේදී සපුරාලීමට හැකිවූයේ මුළු ඉල්ලුමෙන් සියයට 46 ක් පමණි.

යටිතල ව්‍යුහ පහසුකම් කාර්යක්ෂම අයුරින් සැපයීමේදී පෞද්ගලික අංශය වඩාත් කාර්යක්ෂමව ක්‍රියා කරන බව වර්තමානයේදී පොදුවේ පිළිගෙන ඇත. කෙසේවුවද, ශ්‍රී ලංකාව පිළිබඳව බලන කළ, පවත්නා සම්පත් හිඟය, දේශීය පෞද්ගලික අංශයෙහි සහභාගිත්වය සීමා කර ඇත. එම නිසා, යටිතල ව්‍යුහ අංශයෙහි විදේශ ආයෝජක සහභාගීත්වය දිරි ගැන්විය යුතුව ඇත. තවද, නව තාක්ෂණය හා පරිපාලනමය විශේෂඥ දැනුම ලබා ගැනීමටත් විදේශීය පෞද්ගලික අංශයේ සහභාගිත්වය උපකාරී වේ. නව විදුලි පණිවුඩ හුවමාරු තාක්ෂණය යොදා ගැනීම සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය තුළින් තරඟකාරිත්වය වර්ධනය වීමෙන් පාරිභෝගිකයන්ට මෙන්ම විදුලි පණිවුඩ හුවමාරු අංශයට ද ප්‍රතිලාභ ලැබිය හැක. මක්නිසාදයත් තාර්කික මිල ප්‍රතිපත්තීන් මගින් ව්‍යවසායයන්ගේ වාණිජමය පැවැත්මද, ගුණාත්මක බවින් ඉහළ සේවාවක් පවත්වා ගැනීමද සහතික කරන බැවිනි. මේ අතර, යටිතල ව්‍යුහ සේවා සැපයීමේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීමට, ඒ හා අදාළ නීතිමය විධිවිධාන රාමුව, විනිවිද පෙනෙන සුළු හා පක්ෂග්‍රාහී නොවන ලෙස සකස්කල යුතුය. එමෙන්ම, පාරිභෝගික අයිතිවාසිකම් හා සේවා සපයන්නන්ගේ අයිතිවාසිකම් ද එම ආයතනික රාමුවක් මගින් සුරැකිය යුතු වේ.

යටිතල ව්‍යුහ අංශයෙහි, පෞද්ගලික අංශයේ පුළුල් සහභාගීත්වයක අවශ්‍යතාවය ශ්‍රී ලංකා රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් මූලික වශයෙන් දැනටමත් පිළිගෙන ඇත. එහි සඳහන් පරිදි පෞද්ගලික අංශයේ සීඝ්‍ර වර්ධනයට අනුපූරකව යටිතල ව්‍යුහ ඉදි කිරීමට රාජ්‍ය ආයෝජන අවශ්‍ය වේ. කෙසේවුවද, යටිතල ව්‍යුහ පහසුකම් ප්‍රමාණවත් පරිදි සපුරාලීමට අවශ්‍ය වන්නා වූ සම්පත් ප්‍රමාණය අතිවිශාල වන බැවින් යටිතල

---

[1]/අනාගතය සඳහා පදනම - රජයේ ආර්ථික ප්‍රගතිය 1994/1995
ශ්‍රී ලංකා රජය - කොළඹ - 1995

**විශේෂ සටහන 2 (සම්බන්ධයි)**

ව්‍යූහ ආයෝජනයෙන් සැළකියයුතු ප්‍රමාණයක් පෞද්ගලික අංශය විසින් දැරිය යුතුයි. මහාමාර්ග, බලශක්තිය, විදුලි සංදේශ සේවා සහ වරාය යන ක්ෂේත්‍රයන්හි රාජ්‍ය ආයෝජන වියදම්වලට වැඩිමනත්ව, පෞද්ගලික අංශයේ සහභාගීත්වය අපේක්ෂා කෙරේ. පෞද්ගලික අංශයේ යටිතල ව්‍යූහ ආයෝජන "ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කර ගැනීම" (BOO) සහ "ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම" (BOT) පදනම යටතේ සිදු වියහැක." (ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය - 1995)

මේ අනුව, පෞද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රධාන වශයෙන් මෙම පදනම් දෙක යටතේ (BOO/BOT) දිරිමත් කළයුතුව ඇත. ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOT) ප්‍රතිපත්ති යටතේ, පෞද්ගලික ව්‍යවසායකයා, නිශ්චිත කාලච්ඡේදයකට සේවාව මූල්‍යනය කිරීමට, ඉදි කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට එකඟ වන අතර, අනතුරුව මෙම සේවාව රජය වෙත පවරයි. ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත්කරගැනීම (BOO) වැඩපිළිවෙල යටතේ සේවාවේ හිමිකම අවසානයේදී ව්‍යවසායකයා සතු වේ. වර්තමානයේදී, යටිතල ව්‍යූහ පහසුකම් සැපයීමේදී පෞද්ගලික අංශ සහභාගීත්ව ක්‍රියාවලිය සෙමින් සිදුවුවද එහි ප්‍රගතියෙහි ස්ථාවරත්වයක් දැකිය හැක. අවශ්‍ය ස්ථිර දේශපාලන ඇප කැපවීම දැනටමත් සහතික කර ඇති බැවින්, විශේෂයෙන්ම ආරක්ෂක තත්ත්වය ඇතුළුව ආයෝජන වාතාවරණයෙහි යහපත් නැඹුරුවක් ඇති වූ විට මෙම ක්‍රියාවලියෙහි සීඝ්‍ර ප්‍රගතියක් ඇති වීමට බොහෝ දුරට පිළිවන.

බලශක්ති අංශය හා අදාළව, ඉහත සඳහන් පදනම් යටතේ (BOO/BOT) ව්‍යාපෘති කිපයක්ම සැළකිල්ලට බදුන් වූ අතර 1995 අවසානයේදී, එහි ප්‍රථම ව්‍යාපෘතිය (සපුගස්කන්ද මෙගවොට් 51 ඩීසල් විදුලි බලාගාරය) සඳහා වූ සාකච්ඡා, 1995 අවසානයේදී නිම කළේය. විදුලි සංදේශ සේවා අංශය, ආර්ථිකයේ සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවත්නා අංශවලින් එකක් වන අතර, පෞද්ගලික අංශය දැනට එහි ප්‍රධාන ක්ෂේත්‍ර 6 ක කාර්යයන්හි නියැලී ඇත. එම ක්ෂේත්‍ර නම්, රේඩියෝ පේජින් සේවා, සෙලියුලර් ජංගම දුරකථන සේවා,දත්ත හුවමාරු සේවා, ගෙවීම් දුරකථන, ජංගම බාහිර ඇමතුම්, රේඩියෝ පද්ධති සේවා හා බාහිර ඇමතුම් විදුලි සංදේශ පද්ධතියයි. මේ අතර වර්ධනය වෙමින් පවත්නා දුරකථන ඉල්ලුම සපුරාලීම සඳහා සැලසුම් කළ දුරකථන 1,50,000 සැපයීමේ ව්‍යාපෘතියෙහි සමාගම් 7 ක් ආයෝජනය කර ඇත. වරාය සේවා පුළුල් කිරීම් සඳහා වූ පෞද්ගලික අංශ සහභාගීත්වයට අදාල මූලික පියවර දැනටමත් සම්පූර්ණ කර ඇත. 1995 දී, ගාල්ල වරාය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ විය. පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව කොළඹ වරාය පුළුල් කිරීමේ කටයුතු දැනට සළකා බලමින් පවතී. නුදුරු අනාගතයේදී, පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිගැන්විය යුතු අනෙකුත් ක්ෂේත්‍ර වනුයේ විදුලිබලය, මාර්ග සහ මහා මාර්ගයි.

ප්‍රතිකාර කරනු ලැබේ. 1995 දී පුද්ගලයන් 1000 ක් සඳහා පැවති සාමාන්‍ය රෝහල් ඇඳන් සංඛ්‍යාව 3 කි. රෝග නිවාරණ හා වැළැක්වීමේ සේවාවන්හි යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව පුද්ගලයන් 100,000 කට 1994 දී 23 සිට 1995 දී 25 දක්වා වැඩි විය. මේ අතර, පුද්ගලයන් 100,000 කට සිටින හෙදි සංඛ්‍යාව පෙර වසරේදී මෙන්ම 73 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. සෞඛ්‍ය සේවා තත්ත්වයෙහි පහත වැටීමකට තුඩු දෙමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ පහසුකම් ඌන උපයෝජනයද, ද්විතිය හා තෘතිය මට්ටමේ පහසුකම් සඳහා අධි පීඩනයද, සෞඛ්‍ය සේවා සැපයීමේ ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව පැවති ප්‍රධාන ගැටළුව විය. වඩාත් සමාන ලෙස පැතිරී පවත්නා සෞඛ්‍ය පහසුකම් හා සමඟ රෝගීන් නිසි ලෙස රෝහල් කරා යොමු කිරීමේ වඩා කාර්යක්ෂම ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාවය මෙයින් අවධාරණය කෙරේ. සෞඛ්‍ය මිනිස් බල අංශය හා අදාලව විශේෂඥ වෛද්‍ය හිඟය ප්‍රධාන බාධකයක් ලෙස නොකඩවා පැවතින. 1995 දී සේවය කළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 40 ක් පමණක් විය.

රෝග වැළැක්වීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා බෝවෙන රෝග මර්ධනය, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, වසංගත රෝග මර්ධනය හා පවුල් සෞඛ්‍ය ප්‍රවර්ධනය වැනි කටයුතු කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණ. ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් (ලෝ.සෞ.සං.) නිර්දේශ කළ නව උපාය මාර්ග හා අනුකූලව මැලේරියා මර්ධන ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කරන ලදී. මැලේරියා මර්ධනය සඳහා ජංගම සායන හඳුන්වා දීම, අධික මැලේරියා අවදානමට ලක් වූ ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වීම, කල් තබා රෝග සොයා ගැනීමේ කටයුතු, ස්වාරක්ෂක ක්‍රම ප්‍රවර්ධනය සහ සෞඛ්‍ය අධ්‍යාපනික වැඩපිළිවෙල 1995 දී මැලේරියා රෝගය තියුණු ලෙසින් අඩු කිරීමට (1994 දී පුද්ගලයන් 273,433 සිට 1995 දී පුද්ගලයන් 141,293 දක්වා) හේතු විය. ඒඩ්ස් රෝගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙල කීපයක්ම ක්‍රියාත්මක කළ අතර මෙම සේවාවන් ප්‍රාදේශීය සහ ප්‍රාථමික මට්ටම් කරා ව්‍යාප්ත කරනු ලැබිණ. ශ්‍රී ලංකාවෙන් පෝලියෝ රෝගය පූර්ණ වශයෙන් තුරන් කරලීම සඳහා, 1995 වර්ෂය අවසානයේදී ජාතික ප්‍රතිශක්තිකරණ දිනයක් පවත්වන ලදී. මෙම වැඩපිළිවෙල ඉතාමත් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ අතර අවුරුදු 5 ට අඩු ළමයින්ගෙන් සියයට 95 ක් එන්නත් කරනු ලැබිණ. අයඩින් සහිත ලුණු භාවිතය ප්‍රචලිත කිරීම සඳහා 1995 වසරේදී ජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබිණ.

විමර්ශණයට ලක්වන වර්ෂය තුළදී විශේෂයෙන්ම විදේශීය අරමුදල් සැපයූ ව්‍යාපෘතීන් මගින් විශාල සම්පත් ප්‍රමාණයක් සෞඛ්‍ය සේවාවන්හි යටිතල ව්‍යූහය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම සඳහා යොමු කරනු ලැබිණ. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සැපයූ දෙවන සෞඛ්‍ය ජනගහණ ව්‍යාපෘතිය 1995 දී ද ක්‍රියාත්මක විණි. කොරියානු ආධාර ඇතිව මූලික රෝහල් 2 ක් (ගම්පහ සහ මීගමුව) සංවර්ධනය කිරීම සහ දකුණු කොළඹ මහාරෝග්‍යශාලාව ශික්ෂණ රෝහල් තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ද සම්පාදනය කළේය. චීන රජයේ ආධාර ඇතිව රිජ්වේ ආර්යා ළමා රෝහල වැඩිදියුණු කිරීම පිණිස ගිවිසුමක් අත්සන් කරනු ලැබිය. මේ අතර, හදිසි අනතුරු ප්‍රතිකාර ඒකක, පර්යේෂණාගාර, සෞඛ්‍ය අධ්‍යාපන ඒකක සහ ගිලන් රථ ආදී පහසුකම් වලින් යුක්තව එක් එක් දිස්ත්‍රික්කයකට රෝහල බැගින් වසරකට රෝහල් 25

## මානව සංවර්ධන නිර්ණායක

**විශේෂ සටහන 3**

සංවර්ධනය පිළිබඳ නිර්වචනය කිරීමේදී යොදා ගන්නා ආර්ථික වෘද්ධිය පිළිබඳ සම්ප්‍රදායික මිණුමට වඩා බෙහෙවින් පුළුල් නිර්වචනයක් මානව සංවර්ධන සංකල්පයට ඇත. මෙම සංකල්පයට අනුව සංවර්ධනයේ අවසාන අරමුණ විය යුත්තේ වර්තමාන සහ අනාගත පරම්පරාවන්ට ලබාගත හැකි ආර්ථික මෙන්ම සමාජ වරණයන් වැඩි දියුණු කිරීම මගින් මුළු ජනතාවම සංවර්ධනය කිරීමයි. එම සංවර්ධනය සියළුදෙනා වෙතම ළඟා වියයුතු අතර කිසිවෙක් එම ක්‍රියාවලියෙන් බැහැර නොවිය යුතු බවද එය තවදුරටත් පෙන්වා දෙයි. සංවර්ධනය, සමාජයේ සියලුම පුද්ගලයන්ට ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලනික ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමටත්, ඉහළම අයුරින් ක්‍රියාවට නැගීමටත් සමාන අවස්ථා සලසා දිය යුතු අතර සියලු දෙනාටම දිගුකල් පවත්නා සාධාරණ ජීවන තත්ත්වයක්ද සහතික කළ යුතුය.

මානව සංවර්ධන ප්‍රවේශය, සංවර්ධනය පිළිබඳව පොදුවේ පිළිගත් නිර්වචන එනම්, ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය, මානව සම්පත් සංවර්ධන සංකල්පය, සුභසාධක සංකල්පය සහ මූලික අවශ්‍යතා සංකල්පය වැනි සම්ප්‍රදායික සංකල්පයන්ගෙන් වෙනස් වේ. ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන සංකල්පය, මානව සංවර්ධනය සඳහා අවශ්‍ය එහෙත් ප්‍රමාණවත් නොවන්නකි. ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ ශීඝ්‍ර වර්ධනයක් තිබියදි වුවත් සමාජයක් තුළ ප්‍රමාණවත් මානව සංවර්ධනයක් නොතිබිය හැකිය. ආදායමේ ඉහළ යාමක් ආර්ථික සංවර්ධනයේ ඒකායන අරමුණක් ලෙස සලකනවාට වඩා මානව සංවර්ධනයේ ඉහළ මට්ටම් කරා ළඟාවීමේ මාධ්‍යයක් සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ජීවන තත්ත්වයක් ලබා ගැනීමේ මාර්ගයක් ලෙස සැලකිය යුතුය. මානව සම්පත් සංවර්ධන ප්‍රවේශයට අනුව මූලික වශයෙන් මිනිසා සංවර්ධනයේ අවසන් ප්‍රතිලාභියෙකු ලෙස සලකනවාට වඩා භාණ්ඩ නිෂ්පාදනයේ ප්‍රාථමික මාධ්‍යයක් හෝ මෙවලමක් ලෙස සැලකේ. එහෙත් එම ක්‍රියාවලිය තුළදී ඔවුන්ගේ ආර්ථික හා සමාජ වරණයන් වැඩිදියුණු වීමට ඉඩ ඇත. සුභසාධක සංකල්පය ආදායම් ව්‍යාප්තිය අවධාරණය කරමින් මිනිසා සංවර්ධන කාර්යයෙහි සහභාගිවන්නකුට වඩා ප්‍රතිලාභියෙක් ලෙස සලකයි. මූලික අවශ්‍යතා ප්‍රවේශය මගින් අවධාරණය කෙරෙන්නේ ප්‍රාථමික අවශ්‍යතා සපුරාලන අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ සේවා නොකඩවා ලබාගත හැකි පදනමක් සියල්ලනටම ලබා ගතහැකි තත්ත්වයක් නිර්මාණය කිරීමයි. කෙසේ වුවද සැබෑ සංවර්ධනය යනුවෙන් අදහස් කරනුයේ ජීවිත ගැටගසා ගැනීම පමණක් නොව යමකු ඉදිරියේ ඇති අවස්ථා වැඩි කිරීම හා මිනිස් ජීවිතයේ ගුණාත්මක බව සහ සැමට සමාන අවස්ථා සැලසීම යනාදියේද වර්ධනයයි. එය නිෂ්පාදනය සහ ආදායම් ව්‍යාප්තිය මෙන්ම සමාජ ආර්ථික සංස්කෘතික සහ දේශපාලනික ක්ෂේත්‍රයන්හි සහභාගිවීමේ අවස්ථාවන්ද එකවර අවධාරණයට ලක් කරයි.

මානව සංවර්ධනය මිනීමට නිර්ණායකයන් විශාල සංඛ්‍යාවක් යොදාගත හැකි වුවද එසේ කිරීමෙන් ව්‍යාකූල චිත්‍රයක් ඇති කරන හෙයින්, මෙම සියළු නිර්ණායකයන් පහත දැක්වෙන පරිදි ප්‍රධාන විචල්‍යයන් හෙවත් නිර්නායකයන් තුනකට සංක්ෂිප්ත කර දක්වයි.

(අ) ජීවිත අපේක්ෂාව - මෙය දිගුකලක් ජීවත්වීමට දායක වන සෞඛ්‍ය පහසුකම්වල සුලභ බව, පෝෂණ තත්ත්වය ආදී සංවර්ධනයේ බොහෝ අංශයන්ද ආවරණය කරයි.

(ආ) සාක්ෂරතා අනුපාතය - මෙය දැනුම සහ අනෙකුත් මානව සම්පත් සංවර්ධනයට අදාල යෙදවුම් හා සම්බන්ධ වේ.

(ඇ) ආදායම් නිර්නායක - මෙය ප්‍රමාණවත් ආදායම, ජීවිතයේ අනෙකුත් බොහෝ අවශ්‍යතාවන් පහසුවෙන් ලබාගත හැකි බව සහතික කරයි. ආදායමේ නිරපේක්ෂ මට්ටම පමණක් නොව එම ආදායමෙන් මිලදී ගත හැක්කේ කුමක්ද යන්න පිළිබිඹු කිරීම සහ අන්තර් ජාතික වශයෙන් සසඳා බැලීම සඳහා එක්සත් ජනපද ඩොලර් වලට ගලපන ලද මිලදී ගැනීමේ හැකියාව පෙන්නුම් කරන ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනය මෙහිදී සැළකිල්ලට ගැනේ.

මානව සංවර්ධන දර්ශකය ඉහත දක්වන ලද විචල්‍යයන් තුන පදනම් කරගෙන ගණනය කරනු ලැබේ. එය මානව සංවර්ධනයේ අපේක්ෂිත මට්ටමක් කරා ළඟා වීම පිළිබඳ දර්ශකයකි. 1/

ඉහළ ගිය සාක්ෂරතාවය හෝ ජීවිත අපේක්ෂාව මගින් ඇතිවන මානව සංවර්ධනය, සියලු දෙනාටම මෙම වාසි ක්‍රියාවේ යෙදවීමට අදාල වරණයන්හි සුලභ බව පිළිබඳව අවශ්‍යයෙන්ම සහතික නොකරයි. උදාහරණ වශයෙන් ඉතා ඉහළ අධ්‍යාපනයක් ලැබූ ජනගහනයක් සමඟ උගතුන්ගේ ඉහළ සේවා වියුක්තියක් තිබිය හැකිය. මෙම උගත් පුද්ගලයන් ආර්ථික හා සමාජ සංවර්ධන ක්‍රියාවලියට සහභාගිවීමට ඇති අයිතිය ක්‍රියාවේ යෙදවීමේ අපේක්ෂාවෙන් සිටියද ඔවුන්ට එසේ කිරීමට හැකියාවක් නොමැති විය හැකිය. එබැවින් යමෙකුගේ අධ්‍යාපනය භාවිතයට ගැනීමේ හැකියාව, ආර්ථිකයේ පුළුල්වීම සහ ආර්ථිකයේ පවත්නා අවස්ථාවන්ට යොදා ගැනීමට එම අධ්‍යාපනයේ ඇති යෝග්‍යතාවය මත රඳා පවතී. මානව සංවර්ධනයේ ජයග්‍රහනයන් දිගු කාලයේදී නොනැසී පවත්වාගැනීම රඳා පවතිනුයේ ආර්ථික වෘද්ධියේ ජයග්‍රහනයන් මතය. ඒ නිසා ආර්ථික වෘද්ධිය සමඟ එහි සාධාරණ බෙදී යෑම, ඕනෑම රටක් එහි ජන ජීවිතයේ ගුණාත්මක වර්ධනය ළඟා කර ගැනීමේදී අත්කර ගත යුතු ඉලක්කයන් බවට පත්වේ.

මානව සංවර්ධනය යන සංකල්පයට දේශපාලන නිදහස, එක් එක් පුද්ගලයා විසින් මානව හිමිකම් භුක්ති විඳීම, ආහාර අතින් සුරක්ෂිතතාවය, පරිසර සුරක්ෂිතතාවය, පෞද්ගලික සුරක්ෂිතතාවය, ජන සමාජයේ සුරක්ෂිතතාවය සහ අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සුරක්ෂිත වීම ආදි වෙනත් විවිධ අංශයන්ද සම්බන්ධ වේ. භෞතික ජීවන තත්ත්වය, නිවාස සහ ඒවායේ ගුණාත්මකභාවය, පණිවුඩ හුවමාරුව, ප්‍රවාහනය සහ විනෝදාංශ වැනි අනෙකුත් විචල්‍යයන් මතද රඳා පවතී.

1/ ජීවිත අපේක්ෂාවෙහි, අපේක්ෂිත මට්ටම දීර්ඝ කාලීන සාමාන්‍ය ජීවිත අපේක්ෂාව (අවුරුදු 85) මගින් පෙන්නුම් කරයි. සාක්ෂරතාවෙහි අපේක්ෂිත මට්ටම සියයට සියයක් ලෙස උපකල්පනය කරයි. ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික පාසල්වලට ඇතුලත් කර ගැනීමේ අනුපාතය සැළකිල්ලට ගැනීමෙන් මෙම දර්ශකය තව දුරටත් වැඩි දියුණු කර ගනී. අපේක්ෂිත ආදායම් මට්ටම යනු ක්‍රය ශක්ති සාම්‍යය පදනම් කරගෙන ගණනය කළ දිගු කාලයේදී ලබාගත හැකි ඒකපුද්ගල ද.දේ.නි. යේ උපරිම මිලදී ගැනීම් හැකියා සාමාන්‍යයි. මෙම ආදායම එක්සත් ජනපද ඩොලර් වලින් දක්වා ඇත.

## විශේෂ සටහන 3 (සම්බන්ධයි)

ශ්‍රී ලංකාව, සාපේක්ෂ වශයෙන් අඩු ඒකපුද්ගල ද.දේ.නි. වර්ධනයක් පැවතියද සිත්ගන්නා සුළු මානව සංවර්ධනයක් අත්කර ගත් රටක් ලෙස බොහෝවිට ගෙනහැර දක්වයි. මානව සංවර්ධනයේදී ශ්‍රී ලංකාව ලබාගත් ජයග්‍රහනයන්, බොහෝදුරට 1940 ගණන්වල සිට ක්‍රියාවට නගන ලද සුභසාධන ප්‍රතිපත්තීන්ගේ ප්‍රතිඵලයකි (සංඛ්‍යා සටහන 1)

ඉන්දුනීසියාව, මැලේසියාව, කොරියානු සමූහාණ්ඩුව, සිංගප්පූරුව සහ තායිලන්තය වැනි ශීඝ්‍රයෙන් දියුණු වන රටවල අත්දැකීම් මගින්, ඔවුන්ගේ වේගවත් ආර්ථික සංවර්ධන අනුපාතිකය සමග සැලකිය යුතු මිල ස්ථායීතාවක් පවත්වා ගැනීමේ වැදගත්කම පෙන්වයි. එය මානව සංවර්ධනය හා මිනිස් වරණයන් පුළුල් කිරීම ඒවායේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරීමට හේතුවන බවද සනාථ කරයි. (සංඛ්‍යා සටහන 2) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ මුහුණ දීමට සිදුවී ඇති අභියෝගය වනුයේ එහි මානව සංවර්ධන දර්ශකය පහළ නොවැටී පවත්වා ගැනීම සහ අවම වශයෙන් ශීඝ්‍රයෙන් වර්ධනය වන ලෝක ආර්ථිකයේ වේගයට සමගාමීව වත් පවත්වා ගැනීම සහතික කිරීමය. එමනිසා ශීඝ්‍රයෙන් වර්ධනය වන පෙරදිග ආසියාතික ආර්ථිකයන්ගේ මෙන් ඉහළ මට්ටමක ආයෝජන වර්ධනයක් පවත්වා ගැනීම සහතික කිරීමේ හදිසි අවශ්‍යතාවක් පවතී.

### සංඛ්‍යා සටහන 1

### මානව සංවර්ධන දර්ශකය සහ අනෙකුත් සමාජ දර්ශක

| රට | ජීවිත අපේක්ෂාව 1992 | වැඩිහිටි සාක්ෂරතා අනුපාතය 1992 | මූ.ද.දේ.නි. ඒක පුද්ගල ආදායම එ.ජ.ඩො. (ක්‍රය ශක්ති සාම්‍ය) 1992 | ගැලපුම් කරන ලද ඒක පුද්ගල මූ.ද.දේ.නි 1992 (අ) | මා.ස.ද. 1992 | ඒක පුද්ගල ද.ජා.නි. යේ තරාව - මා.ස.ද. තරාව (ආ) | පුද්ලයන් 100 ක් සදහා වූ රූපවාහිනී සංඛ්‍යාව 1992 | පුද්ගලයන් 100 ක් සදහා වූ දිනපතා පුවත් පත් සංඛ්‍යාව 1992 |
|---|---|---|---|---|---|---|---|---|
| කොරියානු සමූහාණ්ඩුව | 71.1 | 97.4 | 9,250 | 5,249 | 0.882 | 7 | 21 | 41 |
| සිංගප්පූරුව | 74.8 | 89.9 | 18,330 | 5,344 | 0.878 | - 19 | 38 | 34 |
| තායිලන්තය | 69.9 | 93.5 | 5,950 | 5,178 | 0.827 | - 3 | 11 | 7 |
| මැලේසියාව | 70.8 | 81.5 | 7,790 | 5,223 | 0.822 | - 14 | 15 | 12 |
| ශ්‍රී ලංකාව | 71.9 | 89.3 | 2,850 | 2,850 | 0.704 | 5 | 5 | 3 |
| පිලිපීනය | 66.3 | 94.0 | 2,550 | 2,550 | 0.677 | 8 | 5 | 5 |
| ඉන්දුනීසියාව | 62.7 | 82.5 | 2,950 | 2,950 | 0.637 | - 5 | 6 | 2 |
| පකිස්ථානය | 61.5 | 35.7 | 2,890 | 2,890 | 0.483 | - 28 | 2 | 1 |
| මියන්මාර් | 57.6 | 82.0 | 751 | 751 | 0.457 | 29 | ... | 1 |
| ඉන්දියාව | 60.4 | 49.9 | 1,230 | 1,230 | 0.439 | 7 | 4 | 3 |
| බංගලිදේශය | 55.6 | 36.4 | 1,230 | 1,230 | 0.364 | - 5 | ... | 1 |
| නේපාලය | 53.5 | 25.6 | 1,170 | 1,170 | 0.343 | - 25 | ... | 1 |

(අ) මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සදහා ගලපන ලද දත්ත
(ආ) ධන අගයන් මගින් මානව සංවර්ධන දර්ශකය මත වූ තරාව, ඒක පුද්ගල ද.ජා.නි. ය මත වූ තරාවට වඩා යහපත් බව පෙන්නුම් කරයි

මූලයන් : මානව සංවර්ධන වාර්තාව - 1995
ලෝක සංවර්ධන වාර්තාව - 1995

### සංඛ්‍යා සටහන 2

### තෝරාගත් රටවල මූලික ආර්ථික දර්ශක

| රට | ද.දේ.නි. යේ වාර්ෂික සමාන්‍ය වර්ධන අනුපාතිකය % | සාමාන්‍ය වාර්ෂික උද්ධමන අනුපාතිකය % | ද. දේ. ආයෝජනයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය % | මානව සංවර්ධනය දර්ශකය (අ) | |
|---|---|---|---|---|---|
| | 1980-93 | 1980-93 | 1980-93 | 1987 | 1992 |
| කොරියානු සමූහාණ්ඩුව | 9.1 | 6.3 | 11.8 | 0.903 | 0.882 |
| සිංගප්පූරුව | 6.9 | 2.5 | 5.7 | 0.899 | 0.878 |
| තායිලන්තය | 8.2 | 4.3 | 11.4 | 0.783 | 0.827 |
| මැලේසියාව | 6.2 | 2.2 | 6.3 | 0.800 | 0.822 |
| ඉන්දුනීසියාව | 5.8 | 8.5 | 7.1 | 0.591 | 0.637 |
| ශ්‍රී ලංකාව | 4.0 | 11.1 | 2.4 | 0.789 | 0.704 |

සටහන : ගණනය කරන ලද ක්‍රමයන්හි වෙනස්කම් නිසා 1987 සහ 1992 සදහා වන මානව සංවර්ධන දර්ශක ඍජු වශයෙන් සංසන්දනය කළ නොහැකිය.

මූලයන් : ලෝක සංවර්ධන වාර්තාව 1995
මානව සංවර්ධන වාර්තා 1990, 1995

සංඛ්‍යා සටහන 5.2

## රජයේ සෞඛ්‍ය සේවය 1991 - 1995

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 * |
|---|---|---|---|---|---|
| 1. ආරෝග්‍යශාලා (බටහිර වෛද්‍ය සේවය) | 504 | 506 | 504 | 510 | 510 |
| 2. ඇඳන් ගණන | 42,437 (අ) | 48,061 | 48,949 | 50,091 | 54,641 |
| 3. මධ්‍යම බෙහෙත් ශාලා | 275 (අ) | 350 | 365 | 370 | 386 |
| 4. මුළු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 2,934 | 3,345 | 3,713 | 4,047 | 4,580 |
| 5. මුළු සහකාර වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 1,201 | 1,253 | 1,305 | 1,357 | 1,324 |
| 6. මුළු ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව | 12,852 | 13,131 | 13,454 | 13,624 | 14,874 |
| 7. මුළු හෙද සේවක සංඛ්‍යාව | 9,934 | 11,214 | 11,818 | 13,060 | 13,310 |
| 8. මුළු උපස්ථායක සංඛ්‍යාව | 5,697 | 5,710 | 5,772 | 5,469 | 5,579 |
| 9. ප්‍රතිකාරලත් අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව (000) | 2,629 (අ) | 3,023 | 3,174 | 3,204 | ලැ.නො. |
| 10. බාහිර රෝගීන්ගේ සංඛ්‍යාව (000) | 28,575 (අ) | 36,827 | 36,892 | 35,276 | ලැ.නො. |
| 11. මුළු සෞඛ්‍ය වියදම (රු: දශ ලක්ෂ) | 5,229 | 6,541 | 7,064 | 9,185 | 10,952 |
| ජංගම වියදම (රු: දශ ලක්ෂ) | 4,110 | 4,518 | 5,711 | 7,666 | 8,818 |
| ප්‍රාග්ධන වියදම | 1,119 | 2,023 | 1,353 | 1,519 | 2,134 |

* තාවකාලික
(අ) උතුර හා නැගෙනහිර පලාත් ඇතුලත් නැත.

මූලයන්: සෞඛ්‍ය, මහාමාර්ග සහ සමාජසේවා අමාත්‍යාංශය.
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගනු ලැබිණ. ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ රෝහල් 30 ක් පමණ වසර තුලදී ප්‍රතිසංස්කරණය කළේය. 1995 දී ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙහි කැඩුම් බිඳුම්, ඇස්, කන්, උගුරු සහ ළමා ශල්‍ය වාට්ටුද, ක්ෂුද්‍ර ජීවි විද්‍යා ඒකකයක් ද, නැවත ආරම්භ කරනු ලැබිණ.

මේ අතර මෑත කාලයේදී, සෞඛ්‍ය අංශය තුළ පෞද්ගලික අංශයෙහි සහභාගිත්වයෙහි පුළුල්වීමක් දක්නට ලැබිණ. මෙය දිරිගන්වන සුළු සලකුණක් වන අතර, නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවෙහි සෞඛ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකම සමගාමීව පවත්නා බව පෙනෙන්නට ඇත. මෙම තත්ත්වය යටතේ සෞඛ්‍ය අංශයේ සමාජීය ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගන්වන සුළු ප්‍රතිපත්තීන් හා බැඳුණු සම්බන්ධීකරණ පිළිවෙතක් අවශ්‍ය වේ. අතීතයේදී රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශයට සම්පත් ගලායාම හේතුවෙන් පෞද්ගලික අංශය ප්‍රතිලාභ ලැබූ අතර, අවශ්‍ය සෞඛ්‍ය මිනිස් බල සම්පත් තමන් විසින් පුහුණු කිරීම, සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙලවල් ප්‍රවර්ධනය කිරීම, ආදි කටයුතු මගින් පෞද්ගලික අංශය ස්වාධීනව වර්ධනය වීම දිරි ගැන්වීම අවශ්‍ය වේ.

සංඛ්‍යා සටහන 5.3

## සාමාන්‍ය අධ්‍යාපනය 1991-1995

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995* |
|---|---|---|---|---|---|
| 1. මුළු පාසැල් සංඛ්‍යාව | 10,520 | 10,588 | 10,710 | 10,779 | 10,832 |
| රජයේ මුළු පාසැල් සංඛ්‍යාව | 9,998 | 10,042 | 10,160 | 10,191 | 10,239 |
| ජාතික පාසැල් සංඛ්‍යාව | 21 | 39 | 90 | 160 | 198 |
| වෙනත් පාසැල් | 522 | 541 | 550 | 588 | 593 |
| පෞද්ගලික | 459 | 478 | 487 | 509 | 514 |
| පිරිවෙන් | 63 | 63 | 63 | 79 | 79 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 4,258,697 | 4,285,286 | 4,303,493 | 4,327,959 | 4,351,022 |
| රජයේ පාසැල් | 4,135,114 | 4,155,035 | 4,172,897 | 4,193,971 | 4,216,571 |
| වෙනත් පාසැල් | 123,583 | 130,251 | 130,596 | 133,988 | 134,451 |
| පෞද්ගලික | 83,568 | 87,004 | 83,887 | 87,674 | 87,674 |
| පිරිවෙන් | 40,015 | 43,247 | 46,709 | 46,314 | 46,777 |
| 3. අළුතෙන් ඇතුලත් කර ගැනීම් | 388,315 | 359,003 | 354,390 | 339,006 | 342,386 |
| 4. මුළු ගුරුවරු සංඛ්‍යාව | 177,231 | 182,756 | 193,924 | 195,182 | 195,210 |
| රජයේ ගුරුවරු | 170,735 | 175,813 | 186,926 | 187,586 | 187,574 |
| වෙනත් | 6,496 | 6,943 | 6,998 | 7,596 | 7,636 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | 24 | 24 | 22 | 22 | 22 |
| 6. අධ්‍යාපනය සඳහා වූ මුළු වියදම (රු: දශ ලක්ෂ) (අ) | 9,129 | 12,541 | 14,070 | 17,713 | 18,908 |
| වර්තන | 7,951 | 10,533 | 11,225 | 14,836 | 15,784 |
| ප්‍රාග්ධන | 1,178 | 2,008 | 2,845 | 2,877 | 3,124 |

*තාවකාලික
(අ) උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම් ද ඇතුළුව.

මූලයන් : අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.3 අධ්‍යාපනය

අධ්‍යාපනය සඳහා දරණ ලද වියදම රජයේ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස 1994 දි සියයට 11 සිට 1995 දි සියයට 10 දක්වා පහත වැටුනු අතර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එය සියයට 3.1 ක සිට සියයට 2.9 දක්වා අඩු විය. කෙසේ වුවද, රුපියල් වටිනාකම අනුව, අධ්‍යාපනය සඳහා වූ වර්තන වියදම් වසර තුළදී සියයට 6 කින් ඉහළ ගියේය. පාසල් පොත් බෙදා දීමේ වැඩසටහන, නොමිලයේ පාසල් නිල ඇඳුම් බෙදා දීම සහ පාසල් ළමුන්ට සහනදායි මිලට ප්‍රවාහන පහසුකම් සැපයීමේ වැඩසටහන් වර්ෂය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා රුපියල් බිලියන 1.2 ක් වැය කරන ලදී. මීට අමතරව, පෙර පැවති පාසැල් ශිෂ්‍යයන්ට දිවා ආහාර සැපයීමේ වැඩපිළිවෙල වෙනුවට ආහාර මුද්දර සැපයීම සඳහා රුපියල් බිලියන 1.8 ක් වැය කළේය. 1995 අගෝස්තු මස සිට මෙම වැඩපිළිවෙල ද අහෝසි කරන ලදී.

1995 වසර තුළදී පාසල් සංඛ්‍යාව 53 කින් වර්ධනය වූ අතර මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 23,063 කින් ඉහළ ගියේය. ඒ අනුව එක් පාසලකට අයත් වන ශිෂ්‍ය සංඛ්‍යාව මීට පෙර වර්ෂ දෙකේදීම පැවති 402 ක මට්ටමේම පැවතිනි. 1995 වර්ෂයේදී රජයේ පාසල්වලට අළුතින් ගුරුවරුන් 3,177 ක් බඳවා ගත්තද ගුරු-ශිෂ්‍ය අනුපාතය පෙර වර්ෂයේ මෙන්ම 22 ක්ව පැවතිනි.

පාසල් පහසුකම්වල ප්‍රාදේශීය විෂමතාවය පුළුල්වීම, අධ්‍යාපනයේ ගුණාත්මක බව පිරිහීම, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රමාණවත් නොවන සහ ගුණාත්මක වශයෙන් පහත් මට්ටමක පවතින ප්‍රාථමික අධ්‍යාපනික පහසුකම්, අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රධාන ගැටළු ලෙස පැවතිනි. මෙම ගැටළු විසඳීම සඳහා විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතින් කීපයක්ම වර්ෂය තුල අඛණ්ඩව ක්‍රියාත්මක විය. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම තෝරාගත් ප්‍රාථමික පාසල් විශිෂ්ඨ ගණයේ පාසල් බවට වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් දියත් කෙරිණි. 1995 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය යටතේ, සංවර්ධනය කළයුතු පාසල් 278 ක් හඳුනාගෙන තිබුනි. ඉතා දුෂ්කර ප්‍රදේශවල ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම සඳහා සීඩා (SIDA) ආධාර යටතේ නවත් ව්‍යාපෘතියක් දියත් කරන ලදී. අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම, පාසල් යටිතල පහසුකම් පුළුල් කිරීම සහ පාසල් පද්ධතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අරමුණු කර ලෝක බැංකුව සහ අන්තර් ජාතික සංවර්ධන ආයතනය මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබිණ. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ද්විතියික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යමින් ඒ යටතේ පාසල් 141 ක් තෝරාගනු ලැබූ අතර, 1995 වර්ෂය අවසාන වන විට ඉන් පාසල් 60 ක සංවර්ධන කටයුතු ආරම්භ කර තිබුනි. සීඩා මගින් ආධාර සපයනු ලබන වතු අංශයේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතියද වර්ෂය තුල අඛණ්ඩව ක්‍රියාත්මක විය.

දිවයිනෙහි බොහෝ ප්‍රදේශවල, ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් ලබාගැනීමේ පහසුකම් වැඩිකරනු පිණිස, පාසල් 38 ක් ජාතික පාසල් තත්ත්වයට උසස් කරන ලදී. මේ නිසා 1995 අවසානයේදී මුළු ජාතික පාසල් සංඛ්‍යාව 198 ක් විය. මේ අතර ජාතික අධ්‍යාපනික ආයතනය මගින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා නියමිත ප්‍රධාන විෂයයන්ට අදාළ විෂය මාලාව සංශෝධනය කරණ ලදී. ඊට අමතරව,

සංඛ්‍යා සටහන 5.4

### විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය 1991 - 1995


| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|---|
| 1. විශ්ව විද්‍යාල සංඛ්‍යාව | 9 | 9 | 9 | 9 | 10 (අ) |
| 2. ශිෂ්‍ය සංඛ්‍යාව | 28,260 | 31,447 | 30,637 | 30,764 | 32,004 |
| 3. කථිකාචාර්ය වරුන්ගේ සංඛ්‍යාව (ආ) | 1,811 | 1,828 | 1,955 | 2,122 | 2,580 |
| 4. උපාධිලත් සංඛ්‍යාව | 5,386 | 4,564 | 5,056 | 5,493 | ලැ. නො. |
| කලා සහ සෞන්දර්ය අධ්‍යයනය | 1,983 | 1,603 | 1,661 | 2,077 | ලැ. නො. |
| වානිජ සහ කළමනාකරණ අධ්‍යයනය | 1,096 | 769 | 1,169 | 1,044 | ලැ. නො. |
| නීතිය | 98 | 89 | 112 | 183 | ලැ. නො. |
| විද්‍යාව | 1,169 | 1,051 | 913 | 829 | ලැ. නො. |
| ඉංජිනේරු විද්‍යාව | 355 | 379 | 382 | 652 | ලැ. නො. |
| වෛද්‍ය විද්‍යාව | 339 | 334 | 444 | 385 | ලැ. නො. |
| දන්ත ශල්‍ය | 42 | 48 | 69 | 41 | ලැ. නො. |
| කෘෂිකාර්මික | 217 | 188 | 191 | 183 | ලැ. නො. |
| පශු වෛද්‍ය විද්‍යාව | 31 | 32 | 29 | 31 | ලැ. නො. |
| ගෘහනිර්මාන ශිල්පය | 76 | 71 | 86 | 47 | ලැ. නො. |
| 5. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුල්වීම් | 6,463 | 8,970 | 8,900 | 7,849 | 9,649 |

(අ) 1996 වර්ෂයේ පිහිටුවන ලද ගිනිකොන දිග විශ්ව විද්‍යාලයද ඇතුලත් ය.

මූලය : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම

(ආ) වර්ෂය මුලදී

රූපසටහන 5.1
සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම



කලා, වාණිජ සහ ජීව විද්‍යා විෂය ධාරා සඳහා ගණිතය නමින්ද, වාණිජ විෂය ධාරාව සඳහා ව්‍යාපාර සංඛ්‍යානය නමින්ද, නව විෂයයන් දෙකක් වර්ෂය තුලදී හඳුන්වා දෙනු ලැබිණ. සිසුනට නව තාක්ෂණය හැදෑරීමට අවස්ථාව සැලසීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රදේශවල පරිගණක මධ්‍යස්ථාන 12 ක් ආරම්භ කරන ලදී.

උසස් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය පුළුල් කිරීම සඳහා 1995 වර්ෂය තුළදී නව විශ්වවිද්‍යාල තුනක් (බළුවිල්හි ගිණිකොන දිග විශ්වවිද්‍යාලය, අනුරාධපුරයෙහි රජරට විශ්වවිද්‍යාලය සහ රත්නපුරයෙහි සබරගමු විශ්වවිද්‍යාලය) පිහිටුවන ලදී. මේ හේතුවෙන් 1995 දී විශ්වවිද්‍යාල සංඛ්‍යාව 12 දක්වා ඉහළ ගිය අතර විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ෂයකට 1,500 කින් පමණ ඉහළ ගියේය.

විමසුමට ලක් කෙරෙන වර්ෂය තුළදී සිසුන් 9,649 ක් විශ්ව විද්‍යාලවලට ඇතුලත්කර ගත් අතර, 1995 වර්ෂය අවසානයේදී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 32,004 දක්වා ඉහළ ගියේය. අධ්‍යයන කාර්ය මණ්ඩලය 1994 දී 2,122 සිට 1995 දී 2,580 දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස ගුරු ශිෂ්‍ය අනුපාතය 1994 දී 14 ක සිට 1995 දී 12 දක්වා වර්ධනය විය. 1995 වර්ෂය තුළදී කැළණිය, පේරාදෙණිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවලට නව අධ්‍යයන පීඨයන් සහ දෙපාර්තමේන්තු එක් කරමින් තවදුරටත් පුළුල් කෙරිණි. මේ අතර, වර්ෂය තුළදී ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 2,236 කින් ඉහළ ගියේය.

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම, ප්‍රමුඛතා පදනම මත සැලකිල්ලට ලක් වියයුතු මූලික ගැටළුවක් වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම 1995 ජනවාරියේදී නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා ඉදිකිරීම් මෙහෙයුම් උපදේශක ඒකකයක් ස්ථාපනය කරනු ලැබිණ. 1996 වසර අවසාන වන විට විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගෙන් සියයට 50 කට නේවාසිකාගාර පහසුකම් සැපයීමට ඉදිකිරීම් කළමනාකරණ උපදේශක ඒකකය මගින් සැලසුම් කර ඇත.

අවධාරණයට ලක්කළයුතු තවත් වැදගත් ගැටළුවක් වනුයේ, වරින් වර විශ්වවිද්‍යාල වසා දැමීම සහ 1988 සහ 1989 අධ්‍යයන වර්ෂ වලදී බාධා පැමිණීම් නිසා විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමට වසර දෙකකට වඩා ප්‍රමාද වීමෙන් ශිෂ්‍ය කණ්ඩායම්වලට ඇති අවහිරතාවය ඉවත් කිරීමය. 1995 වර්ෂයේදී විශ්වවිද්‍යාල කීපයකට ශිෂ්‍ය කණ්ඩායම් දෙක බැගින් ඇතුලත් කර ගැනීම නිසා මෙම තදබදය යම් තරමකට ලිහිල් කර ගැනීමට හැකි විය. එහෙත් අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි සහ භෞතික සම්පත්හි පවත්නා සීමිත බව මෙම ක්‍රියාමාර්ගයට බාධාවක් වී ඇත. 1995 වර්ෂය තුලදී ඇතිවූ, ශිෂ්‍ය ගැටළු හා කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් විශ්වවිද්‍යාල වරින් වර වසා දැමීමට සිදුවීමෙන් මෙම තත්ත්වය තවදුරටත් ඈයහපත් අතට හැරිණි.

## 5.4 පණිවුඩ හුවමාරු සේවාවන්

1995 දී තැපැල් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලැබූ දේශීය සහ විදේශීය තැපැල් භාණ්ඩ සංඛ්‍යාව සුළු වශයෙන් වැඩි විය. මෙම වැඩිවීමට මූළමනින්ම හේතුවූයේ දේශීය තැපැල් භාණ්ඩ සංඛ්‍යාව වැඩිවීමයි. 1995 වර්ෂයේදී දේශීය පාර්සල් භාණ්ඩ බෙදාහැරීම සියයට 4 කින් වර්ධනය වූ අතර, විදේශීය පාර්සල් භාණ්ඩ බෙදාහැරීම සියයට 7 කින් ඉහළ ගියේය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින් පුරවැසියකුට වසරකදී ලැබෙන සාමාන්‍ය ලිපි සංඛ්‍යාව 29 ක මට්ටමේ නොවෙනස්ව පැවතීම, මහජනතාව වඩාත් වේගවත් පණිවුඩ හුවමාරු මාධ්‍යය කරා ප්‍රවේශවීම සනිටුහන් කරයි.

ප්‍රධාන තැපැල් කාර්යාල 5 ක් ද, උප තැපැල් කාර්යාල 29 ක් සහ නියෝජිත තැපැල් කාර්යාල 9 ක්ද විවෘත කිරීමත් සමග මුළු තැපැල් කාර්යාල සංඛ්‍යාව 1994 දී 4,105 සිට 1995 දී 4,148 දක්වා ඉහළ යමින් තැපැල් කාර්යාල ජාලය තවදුරටත් පුළුල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස තැපැල් කාර්යාලයකින් සේවා සැපයිය යුතු භූමි ප්‍රමාණයේ සාමාන්‍යය 1994 දී වර්ග කිලෝමීටර් 16 ක සිට 1995 දී වර්ග කිලෝමීටර් 15.8 දක්වා පහත වැටුනි. ඒ අතර ෆැක්ස් සේවා සහිත තැපැල් කාර්යාල සංඛ්‍යාව 1994 දී වූ 109 සිට 1995 දී 159 දක්වා ඉහළ ගියේය. ඊට අමතරව සීඝ්‍රගාමී තැපැල් මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ කොළඹ නගරය තුළ අධිවේගී තැපැල් සේවා ද පුළුල් විය. නව මධ්‍යම තැපැල් හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීමේ වැඩකටයුතු අවසන් කර ඇති අතර මෙම මධ්‍යස්ථානය 1996 දී විවෘත කිරීමට නියමිතය. 1995 දි රාජ්‍ය තැපැල් සේවාවන්ගෙන් ලද මුළු ආදායම සියයට 58 කින් වැඩි වූ අතර මෙහෙයුම් වියදම් ඉහල ගියේ සියයට 12 කිනි. මේ අනුව තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය පෙර වසරේදී පැවති රුපියල් දශලක්ෂ 557 ක් හා සසඳන කල 1995 දී රුපියල් දශලක්ෂ 233 ක් විය.

ධාරිතාව සහ සපයන ලද සේවාවන් අනුව විදුලිසංදේශ සේවා අංශයෙහි කටයුතු වර්ධනය විය. දුරකථන සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සහ දැනට පවත්නා සේවාවේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම විදුලි සංදේශ සේවා අංශය හමුවේ පැවති ප්‍රධාන අභියෝගය විය. 1995 වර්ෂයේදී දුරකථන ජාලය වැඩිදියුණු කිරීමෙහිලා පෞද්ගලික අංශය පුළුල් කාර්ය භාරයක් ඉටුකළ අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දැනට පවත්නා විදුලිසංදේශ සේවා පණිවුඩ ජාලය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමෙහිදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද ප්‍රධාන සම්ප්‍රේෂණ පද්ධති ව්‍යාපෘතියද, ලෝක බැංකුව මගින් අරමුදල් සපයන ලද කොළඹ සහ තදාසන්න ප්‍රදේශ සඳහා බාහිර හුවමාරු මධ්‍යස්ථාන සහ ඒ අනුෂාංගික උපකරණ සැපයීමද, විදේශ ආර්ථික සහයෝගිතා අරමුදල මගින් අරමුදල් සපයන ලද මහ කොළඹ විදුලි සංදේශ ජාල සංවර්ධන ව්‍යාපෘති අදියර 1 සහ 11 ද, සීමාසහිත පින්ලන්ත ණය මගින් අරමුදල් සපයන ලද මාතර ව්‍යාපෘතිය දියුණු කිරීමද, 1995 වසරේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ක්‍රියාවේ යොදවන ලද ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රමයන් විය. මෙම ව්‍යාපෘතීන් මගින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සිය සේවාවන් තවදුරටත් පුළුල් හා නවීකරණය කරනු ලැබිණ. වර්ෂය තුළදී මාදම්පේ සහ දඹුල්ලේ නව සංඛ්‍යාංක දුරකථන හුවමාරු මධ්‍යස්ථාන දෙකක්ද, මාතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල නව දුරකථන හුවමාරු මධ්‍යස්ථානද ආරම්භ කරන ලදී. මෙම වර්ධනයන් සමග 1995 වසරේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් එහි හුවමාරු පොලවල ධාරිතාවය දුරකථන මාර්ග 258,300 දක්වා සියයට 9 කින් වර්ධනය කළේය. මේ අතර පාදුක්ක නව චන්ද්‍රිකා පෘථිවි පණිවුඩ හුවමාරු මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර දුරකථන හුවමාරු ස්ථානයක් ද ආරම්භ කිරීමත් සමග ජාත්‍යන්තර විදුලි පණිවුඩ සේවාව ගුණාත්මක වශයෙන්ද ඉහළ ගියේය.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් 1995 වසරේදී "ෆොලෝ මී" (follow me) පහසුකම්, කලින් වෙන් කරවාගත්

සංඛ්‍යා සටහන 5.5

## තැපැල් හා විදුලි සංදේශ සේවාවේ වර්ධනය 1991 - 1995

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 * |
|---|---|---|---|---|---|
| 1. තැපැල් සේවය | | | | | |
| තැපැල් බෙදීමේ කොට්ඨාශ ගණන | 6,729 | 6,729 | 6,729 | 6,729 | 6,729 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ප්‍රදේශය(ව.කි.මී) | 16.5 | 16.3 | 16.2 | 16.0 | 15.8 |
| තැපැල් කාර්යාල සංඛ්‍යාව | 3,982 | 4,018 | 4,042 | 4,105 | 4,148 |
| රාජ්‍ය අංශය | 3,884 | 3,891 | 3,895 | 3,932 | 3,966 |
| පෞද්ගලික අංශය | 98 | 127 | 147 | 173 | 182 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන ජන සංඛ්‍යාව | 4,331 | 4,331 | 4,359 | 4,365 | 4,393 |
| එක් පදිංචිකරුවෙකුට ලැබුණු ලිපි ගණන | 29 | 27 | 28 | 29 | 29 |
| මුළු ආදායම (රු. දශලක්ෂ) | 573 | 684 | 764 | 840 | 963 |
| වර්තන වියදම (රු. දශලක්ෂ) | 865 | 987 | 1,036 | 1,397 | 1,441 |
| මෙහෙයුම් අලාභය (රු. දශලක්ෂ) | (292) | (303) | (272) | (557) | (478) |
| 2. විදුලි සංදේශ සේවය | | | | | |
| දේශීය දුරකථන සේවය | | | | | |
| දුරකථන මාර්ග සංඛ්‍යාව | 125,834 | 135,504 | 157,774 | 180,724 | 204,350 |
| අළුතින් දෙනු ලැබූ දුරකථන සංඛ්‍යාව | 6,579 | 10,607 | 22,270 | 25,322 | 24,556 |
| පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 61,313 | 96,207 | 124,066 | 186,245 | 237,800 |
| දුරකථන සඳහා ඉල්ලුම (සංඛ්‍යාව) | 187,147 | 231,711 | 281,840 | 366,969 | 442,150 |
| දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100කට දුරකථන සංඛ්‍යාව) | 0.73 | 0.78 | 0.90 | 1.01 | 1.13 |
| විදේශ විදුලි සංදේශ සේවය | | | | | |
| ටෙලෙක්ස් සම්බන්ධක ගණන | 1,740 | 1,583 | 1,626 | 1,845 | 1,478 |
| පොරොත්තු ලේඛනයේ සිටින ගණන | 84 | 103 | 59 | 34 | 29 |
| එතෙර ඇමතුම් (සංඛ්‍යාව) | | | | | |
| එතෙර දුරකථන ඇමතුම් සංඛ්‍යාව (අ) | 15,599,912 | 17,775,066 | 19,900,000 | 23,800,000 | 27,000,000 |
| එතෙර විදුලි පණිවුඩ (ආ) | 2,465,682 | 2,483,002 | 2,220,000 | 2,201,448 | 1,948,861 |
| එතෙර ටෙලෙක්ස් පණිවුඩ (අ) | 4,346,467 | 4,230,994 | 3,300,000 | 2,625,092 | 1,932,045 |

* තාවකාලික
අ) සංඛ්‍යා දැක්වෙන්නේ මිනිත්තු වලිනි
ආ)සංඛ්‍යා දැක්වෙන්නේ වචන වලිනි

මූලයන් : තැපැල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා ටෙලිකොම්.

අංකිත සේවා (hot line) සහ විද්‍යුත් තැපැල් (E-Mail) යන සේවාවන්ද හඳුන්වා දෙන ලදී. ඊට අමතරව 1995 වසර තුලදී ව්‍යාපාරික කටයුතුවල ප්‍රයෝජනය සඳහා පොදු ස්විච්ගත දත්ත සැකසීමේ පද්ධතිය ආරම්භ කරන ලදී.

දුරකථන සේවා සඳහා වූ ඉල්ලුම 1994 දි වූ සියයට 30 ක වර්ධනය සමග සසඳා බලන විට 1995 දි සියයට 21 කින් වර්ධනය විය. 1995 වසරේදී මහජනතාවට නව දුරකථන සම්බන්ධතා 24,556 ක් ලබා දී ඇත. එහෙත් දුරකථන සඳහා පවතින මුළු ඉල්ලුමෙන් (දුරකථන සම්බන්ධතා 204,350) එහි බලධාරීන් විසින් ලබා දීමට සමත් වී ඇත්තේ සියයට 46 ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස පොරොත්තු ලේඛනවල ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 1994 දී 1,86,000 ක සිට 1995 අවසානය වන විට 2.37,800 දක්වා ඉහළ ගොස් ඇත. දුරකථන ඝනත්වය හෙවත් පුද්ගලයින් සියයකට ඇති දුරකථන සංඛ්‍යාව 1994 දී 1.01 සිට 1995 දී 1.13 දක්වා සුළු වශයෙන් වර්ධනය විය. මෙය කලාපයේ වේගයෙන් දියුණු වන රටවල් සමග සසඳා බලන විට බෙහෙවින් පහත් මට්ටමක පවතී.

1995 වර්ෂය තුලදී නව තාක්ෂණය හඳුන්වා දෙමින්ද, සේවාව ගුණාත්මකව වර්ධනය කරමින්ද, පෞද්ගලික අංශය විදුලි පණිවුඩ සේවා ක්ෂේත්‍රයෙහි ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කළේය. රේඩියෝ පේජින් සේවාවන්, සෙලියුලර් ජංගම දුරකථන සේවා, දත්ත සන්නිවේදන, ගෙවීම් දුරකථන, ජංගම බාහිර ඇමතුම්, රේඩියෝ පද්ධති සේවා සහ බාහිර ඇමතුම් විදුලි සංදේශ පද්ධතිය යන සේවාවන් 6 ක් පෞද්ගලික අංශය මගින් හඳුන්වා දෙනු ලැබිණි. පේජින් යන්ත්‍ර 9,565 ක් සපයමින් සමාගම් 5 ක් පේජින් සේවාව සැපයීමේ නියැලිති. දුරකථන සඳහා පැවති ඉල්ලුම් පීඩනය ලිහිල් කරමින් 1995 දී සෙලියුලර් දුරකථන සමාගම් තුනක් මගින් සපයනු ලැබූ දුරකථන සංඛ්‍යාව 51,316 ක් දක්වා සියයට 76 කින් වර්ධනය වී ඇත. 1995 වර්ෂය අවසාන වනවිට සමාගම් තුනක් මගින් සවි කරන ලද ගෙවීම් දුරකථන 1,597 ක් වූ අතර මෙය පසුගිය වසර සමග සසඳා බලන විට සියයට 76 ක වර්ධනයක් වේ. මේ අතර දිවයින පුරා සීඝ්‍රයෙන් ඉහළ යන දුරකථන ඉල්ලුම සපුරාලීම පිණිස සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සේවාව මගින් දුරකථන මාර්ග 150,000 කින් යුත් විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය (150 කේ ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කරනු ලැබිණ. 1995 වර්ෂය තුලදී සමාගම් 7 කට මේ සඳහා කොන්ත්‍රාත් බාර දෙනු ලැබූ අතර මහනුවර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘතීන් ක්‍රියාත්මකව පැවතිති.

සාම්ප්‍රදායික ජාත්‍යන්තර පණිවුඩ හුවමාරු ක්‍රම වෙනුවට, මහජනයා විසින් ජාත්‍යන්තර සෘජු දුරකථන පහසුකම් විශාල ලෙස භාවිතා කරනු ලැබිණ. 1995 වර්ෂයේදී එතෙර දුරකථන ඇමතීම් (අමතන ලද විනාඩි ගණන අනුව) සියයට 13 කින් වර්ධනය විය. වචන සංඛ්‍යාව අනුව ගණනය කරන ලද විදේශ විදුලි පණිවුඩ සංඛ්‍යාව සියයට 11 කින් පහත වැටුනි. අනෙකුත් ආකර්ශණීය විද්‍යුත් පණිවුඩ මාධ්‍යයන්හි සුලභවීම නිසා 1995 දී විදේශීය ටෙලෙක්ස් පණිවුඩ සංඛ්‍යාව සියයට 26 කින් පහත වැටුනි.

## 5.5 බල ශක්තිය


පෙර වසරවල පැවති උපනතින්ට අනුකූලව 1995 දී විදුලිය බල ඉල්ලුම සියයට 10 කින් වර්ධනය විය. කෙසේ වුවද, විදුලිය බල උත්පාදන ධාරිතාව පිළිවෙලින් තෙවන වසරටත් නොවෙනස්ව පැවතුනි. ඉකුත් වසර වලදී මෙන්ම, ඉල්ලුමෙන්

වැඩි ප්‍රමාණයක් ජල විදුලිබලය මගින් සපුරා ලනු ලැබිණ. වසරේ ප්‍රථම සිවු මස තුළ පැවති දැඩි වියළි කාලගුණය ජල විදුලි බල උත්පාදනය කෙරෙහි බෙහෙවින් අහිතකර ලෙස බලපෑවද, වසරේ අවසාන භාගයේදී මෙම තත්ත්වය බෙහෙවින් යහපත් අතට හැරිනි. කෙසේ වුවද, වසර අවසානයේදී, ඊසාන දිග මෝසම් වැසි නිසි ලෙස නොලැබීම නිසා, ජල විදුලි බල උත්පාදනයට යළි අවහිර කරමින් ජලාශයන්හි ජල මට්ටම සැළකිය යුතු ලෙස පහත වැටුණේය. ඉකුත් වසරේදී මෙන්ම 1995 දිද ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම තියුණු ලෙස වැඩි විය. සුදු ඩීසල්, බැර ඩීසල් සහ භූමි තෙල් පරිභෝජනය හා අදාළව ඉහළ වර්ධන අනුපාතිකයන් වාර්තා කළේය. මේ අතර, කොළොන්නාව සහ ඕරුගොඩවත්ත තෙල් ගබඩා සංකීර්ණයන්ට ත්‍රස්තවාදී ප්‍රහාර වලින් සිදු වූ අලාභ හානි, තෙල් ගබඩා පහසුකම් වල කොටසකට බලපෑ අතර, එය ඔක්තෝබර් මස දින කිහිපයක සැපයුම් හිඟයක් ඇති කිරීමකට හේතු විය. මෙම අලාභ හානි සිදු වූ දේපල යථා තත්ත්වයට පමුණුවාලීම සඳහා ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 30 ක් පමණ වැය වේ යයි අපේක්ෂා කෙරේ.

මූළු බලශක්ති අවශ්‍යතාවයන්ගෙන් සියයට 70 ක් සැපයූ, ප්‍රධාන වශයෙන් දර වලින් සමන්විත වාණිජ නොවන බලශක්ති මූලය 1995 වර්ෂයේදීද ප්‍රධාන බලශක්ති ප්‍රභවය ලෙස තවදුරටත් පැවතින. ඛනිජතෙල් (සියයට 24), විදුලි බලය (සියයට 5) සහ ද්‍රවීකරණය කළ ඛනිජ තෙල් වායු (සියයට 1) ආදී වාණිජ බලශක්ති ප්‍රභවයන් ගෙන් ඉතිරිය සමන්විත විය.

බලශක්ති අංශයෙහි උද්ගත වෙමින් පවත්නා තත්ත්වයන්, විශේෂයෙන්ම තියුණු ලෙසින් වර්ධනය වන ඉල්ලුම, බලශක්තිය හා අදාළ යටිතල පහසුකම් පුළුල් කිරීම සහ ප්‍රබල බලශක්ති සංරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ කඩිනම් අවශ්‍යතාවය අවධාරණය කරයි. උත්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා කඩිනම් පියවර ගනු නොලැබුවහොත් පවත්නා ධාරිතාවයන් විශාල වශයෙන් උපයෝජනය කර තිබීම සහ ජල විදුලි බල ධාරිතාව පාලනය කළ නොහැකි සාධකයන්ට ගොදුරුවීමට ඇති ඉඩකඩ යන කරුණු නුදුරු අනාගතයේදී දැඩි බලශක්ති හිඟයන් ඇති වීමට ඇති ඉඩකඩ පෙන්වයි. 1995 දි පෞද්ගලික අංශයේ සහභාගිත්වය යටතේ ක්‍රියාත්මක

**රූපසටහන 5.2**
**ප්‍රධාන බලශක්ති ප්‍රභවයන්**



5.6 සංඛ්‍යා සටහන

## බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1991 - 1995

| ශීර්ෂය | ඒකක | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) | ප්‍රතිශත වෙනස 1994 | ප්‍රතිශත වෙනස 1995 |
|---|---|---|---|---|---|---|---|---|
| 1. ඛණිජ තෙල් නිෂ්පාදන | | | | | | | | |
| අපනයන කළ ප්‍රමාණය | මෙ. ටො. | 523 | 410 | 590 | 612 | 616 | 4 | 1 |
| අපනයන වටිනාකම | රු. දශලක්ෂ | 3,289 | 2,771 | 3,801 | 3,959 | 4,374 | 4 | 10 |
| | වි.ගැ.හි. දශලක්ෂ | 58 | 45 | 57 | 56 | 56 | -1 | 0 |
| ආනයනය කළ ප්‍රමාණය | | | | | | | | |
| බොරතෙල් | මෙ. ටො. | 1,626 | 1,297 | 1,800 | 1,898 | 1,860 | 5 | -2 |
| පිරිපහදු නිෂ්පාදන | මෙ. ටො. | 219 | 662 | 294 | 288 | 562 | -2 | 95 |
| එල්. පී. ගෑස් | මෙ. ටො. | 18 | 31 | 38 | 50 | 66 | 32 | 32 |
| ආනයන වටිනාකම (මි.ගැ) | | | | | | | | |
| බොරතෙල් | රු. දශ ලක්ෂ | [illegible] | 7,667 | 11,222 | 11,407 | 12,362 | 2 | 8 |
| | වි.ගැ.හි. දශ ලක්ෂ | 171 | 124 | 167 | 161 | 159 | -3 | -1 |
| පිරිපහදු නිෂ්පාදන | රු. දශ ලක්ෂ | 2,567 | 5,526 | 2,554 | 2,442 | 4,812 | -4 | 97 |
| | වි.ගැ.හි දශ ලක්ෂ | 45 | 90 | 38 | 35 | 62 | -9 | 77 |
| එල් පී. ගෑස් | රු. දශ ලක්ෂ | 239 | 495 | 545 | 704 | 1,121 | 29 | 59 |
| | වි.ගැ.හි. දශ ලක්ෂ | 4 | 8 | 8 | 10 | 14 | 23 | 40 |
| බොරතෙල් බැරලයක | රුපියල් | 807 | 803 | 843 | 805 | 903 | -4 | 12 |
| සාමාන්‍ය මිල (මි.ගැ.) | එ. ජ. ඩොලර් | 19.50 | 18.32 | 17.47 | 16,22 | 17.59 | -7 | 8 |
| දේශීය අලෙවිය | මෙ. ටො.(000) | 1,240 | 1,487 | 1,418 | 1,568 | 1,721 | 11 | 10 |
| පෙට්‍රල් | ,, | 160 | 165 | 173 | 184 | 190 | 6 | 3 |
| සුදු ඩීසල් | ,, | 540 | 606 | 666 | 728 | 796 | 9 | 9 |
| බැර ඩීසල් | ,, | 33 | 125 | 18 | 54 | 80 | 199 | 48 |
| සුපිරි ඩීසල් | ,, | 20 | 23 | 23 | 24 | 27 | 5 | 11 |
| භූමිතෙල් | ,, | 173 | 189 | 192 | 207 | 222 | 8 | 7 |
| දැව්තෙල් | ,, | 204 | 252 | 220 | 228 | 238 | 4 | 4 |
| ගුවන් යානා ඉන්ධන | ,, | 73 | 82 | 73 | 79 | 91 | 8 | 15 |
| ගුවන් යානා ගැසොලින් | ,, | ... | ... | ... | ... | ... | - | - |
| එල් පී. ගෑස් | ,, | 37 | 45 | 53 | 64 | 77 | 22 | 20 |
| දේශීය මිල | රු/ලීටර | | | | | | | |
| පෙට්‍රල් | ,, | 30.00 | 33.00 | 35.00 | 35.00 | 40.00 | - | 14 |
| සුදු ඩීසල් | ,, | 11.00 | 11.65 | 12.20 | 11.40 | 12.40 | -7 | 9 |
| බැර ඩීසල් | ,, | 10.60 | 11.15 | 11.60 | 10.70 | 11.70 | -8 | 9 |
| සුපිරි ඩීසල් | ,, | 13.00 | 14.55 | 15.00 | 14.20 | 15.20 | -5 | 7 |
| භූමිතෙල් | ,, | 8.80 | 8,80 | 11.80 | 9.50 | 9.50 | -19 | - |
| දැව්තෙල් | ,, | | | | | | | |
| 500 | ,, | 6.55 | 7.10 | 7,10 | 7,10 | 7,10 | - | - |
| 800 | ,, | 6.25 | 6.80 | 6,80 | 6,80 | 6,80 | - | - |
| 1,000 | ,, | 5.95 | 6.50 | 6,50 | 6,50 | 6,50 | - | - |
| තාර | ,, | 10.90 | 15.15 | 15,15 | 15,15 | 15,15 | - | - |
| එල්. පී. ගෑස් | රු/කි. ග්‍රෑ | 16.54 | 16.54 | 20,00 | 19,23 | 19.23 | -4 | - |
| 2. විදුලිය බලය | | | | | | | | |
| ස්ථාපිත ධාරිතාව | මෙගවොට් | 1,289 | 1,409 | 1,409 | 1,409 | 1,409 | - | - |
| ජල බලය | ,, | 1,017 | 1,137 | 1,137 | 1,137 | 1,137 | - | - |
| තාප බලය | ,, | 272 | 272 | 272 | 272 | 272 | - | - |
| ජනනය කළ ඒකක | ගිගවොට් පැය | 3,376 | 3,540 | 3,979 | 4,364 | 4,786 | 10 | 10 |
| ජල බලය | ,, | 3,116 | 2,900 | 3,796 | 4,089 | 4,517 | 8 | 10 |
| තාප බලය | ,, | 260 | 640 | 183 | 275 | 269 | 50 | -2 |
| මුළු අලෙවිය | ,, | 2,742 | 2,916 | 3,270 | 3,565 | 3,915 | 9 | 10 |
| ගෘහස්ථ | ,, | 644 | 704 | 826 | 928 | 1,034 | 12 | 11 |
| කාර්මික (ආ) | ,, | 958 | 1,058 | 1,224 | 1,413 | 1,527 | 15 | 8 |
| වාණිජ | ,, | 547 | 581 | 641 | 575 | 631 | -10 | 10 |
| පලාත් පාලන ආයතන | ,, | 572 | 544 | 536 | 609 | 683 | 14 | 12 |
| වීදි ආලෝක කිරීම | ,, | 21 | 29 | 43 | 40 | 40 | -7 | - |

(අ) තාවකාලික
(ආ)1994 පෙබරවාරි මස සිට හෝටල් සඳහා වන විදුලිය විකුණුම්ද ඇතුලත් වේ.

මූලයන් : ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව
ලංකා විදුලිබල මණ්ඩලය
කොළඹ ගෑස් සමාගම
ලංකා මෙරයින් සර්විසස් (පෞද්ගලික) සමාගම

කිරීම සඳහා බලශක්ති ව්‍යාපෘති කීපයක්ම සැළකිල්ලට බඳුන් වූවද, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අත්පත් කර ගැනීම / ඉදිකිරීම,ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOO/BOT) පදනම යටතේ එක් ව්‍යාපෘතියක් පමණක් (සපුගස්කන්ද බලශක්ති ව්‍යාපෘතිය) සාකච්ඡාවන්හි අවසාන අදියරට එළඹ තිබුනි.

### විදුලිය බලය

මෙගවොට් 1,137 ක් වූ ජල විදුලි බලයෙන්ද, මෙගවොට් 272 ක් වූ තාප බලයෙන්ද සමන්විත මෙගවොට් 1,409 ක් වූ මුළු විදුලිය බල ස්ථාපිත ධාරිතාවය 1992 සිටම නොවෙනස්ව

පැවතුනි. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) මගින් උත්පාදනය කල මුළු විදුලිබල ප්‍රමාණය 1994 දී ගිගවොට් පැය 4364 සිට 1995 දි ගිගවොට් පැය 4786 දක්වා සියයට 10 කින් වැඩි විය. ඉකුත් තෙවසර තුළදී මුළු විදුලි බල උත්පාදනය සියයට 10 ක සාමාන්‍යයකින් වැඩිවිය. 1995 වර්ෂයේ ප්‍රථම සිවු මසතුළ සියයට 7 කින් පහත වැටුනු ජල විදුලිබල උත්පාදනය අවසාන මාස අට තුළදී සියයට 20 කින් වර්ධනය විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, පසුගිය වසරේ පැවති සියයට 8 හා සසඳන කළ 1995 වසර තුළදී ජල විදුලි බල උත්පාදනය සියයට 10 කින්, ගිගවොට් පැය 4517 දක්වා වැඩි විය. 1995 වර්ෂය මුල් අවධියේදී ඇති වූ ජල විදුලිබල සැපයුම් හිඟය හේතු කොටගෙන වසර තුලදී තාපබල උත්පාදනය ගිගවොට් පැය 269 ක් විය. ඉකුත් වසරේදී වූ තාප බල උත්පාදනය ගිගවොට් පැය 275 ක් විය. තාප බල උත්පාදනයේදී දැරූ ඉන්ධන පිරිවැය 1994 දී පැවති රුපියල් දශලක්ෂ 801 හා සසඳන කළ 1995 දී රුපියල් දශලක්ෂ 903 ක් විය. මේ අතර, විදුලිය බල උත්පාදනය, බෙදාහැරීම සහ සම්ප්‍රේෂණ ක්‍රියාවලියේදී විදුලිය අපතේ යාම නිසා සිදුවූ පාඩුව මුළු විදුලිය බල උත්පාදනයෙන් සියයට 18 ක් වේ යයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1994 වසරේ දැරීමට සිදු වූ පාඩුවට සමානය. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම පිණිස ව්‍යාපෘති කීපයක්ම වසර තුළදී ක්‍රියාත්මක විය. ලංකා විදුලිබල සමාගම (ලං.වි.ස.) විසින් බෙදාහැරීම් පද්ධතියෙහි පාඩු අඩු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති දෙකක් 1994 වසරේදී නිම කළේය. මෙබඳු ප්‍රයත්නයන් මධ්‍යයේ වුවද, උත්පාදන සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ක්‍රියාවලියේදී සිදු වූ පාඩුව අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම (සියයට 18) දැඩි ලෙස අවධානයට ලක් විය යුතු කරුණකි. මෙම පාඩුවෙහි වටිනාකම වසරකට රුපියල් දශලක්ෂ 3,240 ක් ලෙස තක්සේරු කර ඇත.

1995 දී ලං.වි.ම. මගින් සිදු කළ විදුලිය අලෙවිය සියයට 10 කින් වර්ධනය විය. මෙය පසුගිය වසර කීපය තුළදී නිරීක්ෂිත විදුලිබල ඉල්ලුමෙහි ඉහළ නගින උපනතිය, තවදුරටත් ක්‍රියාත්මක වීමකි. ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම පුළුල් වීමත් සමගම සියයට 13 කින් දේශීය පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව ඉහළ යාම නිසා (දශලක්ෂ 1.221 සිට දශලක්ෂ 1.380 දක්වා) ගෘහස්ථ අංශයෙහි ඉල්ලුම සියයට 11 කින් වැඩි විය. පුළුල් වන ආර්ථික කටයුතු පිළිබිඹු කරමින්, කර්මාන්ත හා වාණිජ අංශයන්ට කළ විදුලිය අලෙවිය පිළිවෙලින් සියයට 8 කින් සහ සියයට 10 කින් වර්ධනය විය. ලංකා විදුලිබල සමාගම මගින් සිදුකල විදුලිය අලෙවිය සියයට 13 කින් වැඩි වුණු අතර මෙයට ප්‍රධාන හේතුව වූයේ ගෘහස්ථ අංශයට කළ විදුලිය අලෙවිය වැඩිවීමයි. ලං.වි.ස. මගින් විදුලිය සැපයූ පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව සියයට 7 කින් වැඩි වී 1995 අවසානයට 2,54,000 ක් විය.

1995 වර්ෂය තුළදී විදුලිය බල ගාස්තු නොවෙනස්ව පැවතුනි. කර්මන්ත හා වාණිජ ව්‍යවසායකයින් විසින් තවදුරටත් ගෘහස්ථ අංශයට හරස් සහනාධාර සපයනු ලැබිණ. විවිධ කොටස් සඳහා වූ මිල විශේෂණ ප්‍රතිපත්ති මගින් ඒකක උත්පාදන පිරිවැයට වඩා ඉහළ මට්ටමක සමස්ත සාමාන්‍ය ඒකක මිලක් සහතික කලද, දිගු කාලයේදී පුළුල් සේවාවක් පවත්වා ගැනීම සහ වාණිජමය පැවැත්මක් සහතික කිරීම සඳහා අවශ්‍ය වන සියයට 8 ක ඉපයීම් අනුපාතිකය, මෙම මිල ව්‍යුහයෙන් ජනිත කරනු නොලැබිණ. මේ නිසා 1996 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි විදුලිබල ගාස්තු වැඩි කිරීමට තීරණය කරනු ලැබිණ.

1995 දී, ලං.වි.ම.ය, විදුලිබල හා අදාළ යටිතල ව්‍යුහය පුළුල් කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩි දියුණු කිරීම පිණිස රුපියල් බිලියන 2 ක් ආයෝජනය කළේය. ප්‍රධාන ව්‍යාපෘති සඳහා වූ මුළු ආයෝජනයෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් විදුලිබල බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ පද්ධතිය සංවර්ධනය කිරීම පිණිස වැය කරන ලදී. වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘතීන් වූයේ විදේශ ආර්ථික සහයෝගිතා සංවිධානය විසින් මූල්‍යනය කල සම්ප්‍රේෂණ සැති වැඩි දියුණු කිරීම හා සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 670) සහ සම්ප්‍රේෂණ සහ උප පොළ සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 270), ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය මගින් මුදල් සැපයූ විදුලිබල බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 197) සහ දෙවන විදුලිබල බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 178) යන ව්‍යාපෘතීන්ය. ආසියානු සංවර්ධන බැංකුව මගින් සැපයූ රුපියල් දශලක්ෂ 406 ක් ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම සඳහා වැය කරනු ලැබිණ. සපුගස්කන්ද ඩීසල් විදුලි බල ව්‍යාපෘතිය (මෙගවොට් 40) සඳහා රුපියල් දශලක්ෂ 298 ක් වැය කළේය. පෙර වසරේදී මෙන්ම, 1995 දීද ලං.වි.ම. විසින් මුළු සැලසුම් කල වියදමෙන් සියයට 46 ක්වූ ඉහළ මට්ටමේ ඌන වියදම් අනුපාතිකයක් වාර්තා කළේය. ලං.වි.ම. ප්‍රභවයන්ට අනුව මෙයට ප්‍රධාන හේතු වූයේ ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී ප්‍රමාදවීම්, කොන්ත්‍රාත් කරුවන්ගේ අසතුටුදායක ක්‍රියාකාරීත්වය සහ අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයන්ය.

විවරණයට ලක්වන වසර තුළදී පෞද්ගලික අංශය විදුලි බල උත්පාදනය කෙරෙහි දිරි ගැන්වීම සඳහා පියවර කීපයක්ම ගනු ලැබිණ. ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ හිමිකම තබා ගැනීමේ පදනම (BOO) යටතේ සැලකිල්ලට බඳුන් වූ ඇතැම් ව්‍යාපෘතීන් වූයේ, සපුගස්කන්ද ඩීසල් විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 51), සංයෝග චක්‍රීය විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො.120/150), බාජ් මවුන්ටඩ් විදුලිබල ව්‍යාපෘති (මෙ.වො. 50 සහ 60), හම්බන්තොට පිරිපහදු ව්‍යාපෘතිය හා අනුබද්ධිත විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො.300), ත්‍රිකුණාමලයේ ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො.300), සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බල ව්‍යාපෘතිය (මෙ.වො.40) යි. මීට අමතරව, කුඩා ප්‍රමාණයේ ජල විදුලි බල ව්‍යාපෘති 9 ක් සහ සුළං මගින් ක්‍රියාත්මක වන විදුලි බල ව්‍යාපෘතියක් (මෙ.වො. 12) ක්‍රියාත්මක කිරීම සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කර ඇත.

මේ අතර බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව කම්පැක්ට් ප්ලොරසන්ට් විදුලි බල්බ සහනදායි මිලකට සැපයීමෙන් ඒවා භාවිතය දිරි ගැන්වීමේ වැඩපිළිවෙලක් 1995 දි හඳුන්වා දෙනු ලැබිණ. වසර තුලදී මෙවැනි විදුලි බල්බයන් 85,000 ක් අලෙවි කරනු ලැබිණ. බලශක්ති සංරක්ෂණ උපකරණ තොග සැපයුම් සහ සවිකිරීම් දිරිමත් කිරීම සඳහා ලං.වි.ම. විසින් ජාතික සංවර්ධන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අනුග්‍රහය ඇතිව සහනදායි පොළී ක්‍රමයක් යටතේ විශේෂ ණය ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණ.

## ඛනිජ තෙල් නිෂ්පාදිත

1995 දි ඛනිජ තෙල් ආනයන පරිමාව සියයට 2 කින් පහත වැටුනේය. ඛනිජ තෙල් පිරිපහදුව නඩත්තු කටයුතු සඳහා වසා තැබීමේදී සාමාන්‍යයෙන් මෙබඳු අඩුවීමක් දක්නට ලැබේ. මේ අතර, ඛනිජ තෙල් සඳහා වූ සාමාන්‍ය ජාත්‍යන්තර මිල, 1994 දි ඇ.එ.ජ. ඩොලර් 16.22 සිට 1995 දි ඇ.එ.ජ. ඩොලර්

17.59 දක්වා සියයට 8 කින් ඉහළ ගියේය. පිරිපහදු නිෂ්පාදිත ආනයන මගින් අමතර ඉල්ලුම සපුරා ගනු ලැබූ අතර මෙම ආනයන ප්‍රමාණය 1994 මට්ටමට වඩා ආසන්න වශයෙන් දෙගුණයකට සමාන ප්‍රමාණයකින් ඉහළ නැගුනි. කොළඹ ගෑස් සමාගම විසින් ආනයනය කල ද්‍රවීකරණය කල ඛනිජ තෙල් වායු (එල්.පී.ජී.) ආනයන ප්‍රමාණය, පරිමාව අනුව සියයට 32 කින්ද, වටිනාකම අනුව සියයට 59 කින්ද වැඩි විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින් ඛනිජ තෙල් ආනයන සඳහා වූ මුළු වියදම සියයට 35 කින් ඉහළ ගියේය.

රජයේ ආදායම් අරමුණු සඳහා 1995 දී පෙට්‍රල් සහ ඩීසල් මිල ඉහළ නැංවිය. 1995 පෙබරවාරි මසදී නව නිෂ්පාදන බද්දක් හඳුන්වා දීමත් සමගම සියළුම වර්ගයේ ඩීසල් සඳහා වූ මිල ගණන් රුපියලකින් ඉහළ නැංවිය. 1995 ජනවාරි 26 දින සිට බල පැවැත්වෙන පරිදි පෙට්‍රල් සඳහා වූ නිෂ්පාදන බදු ලීටරයකට රුපියල් 2 සිට රුපියල් 7 දක්වා වැඩි කළ අතර ඒ අනුව පෙට්‍රල් මිල ලීටරයකට රුපියල් 5 කින් තවදුරටත් වැඩි කරනු ලැබිණ. පෞද්ගලික මෝටර් රථ මත නව ඩීසල් බද්දක් හඳුන්වා දීම මගින් ඩීසල් මිලෙහි පවතින වාසි සහගත තත්ත්වය අහෝසි කර එම සහනාධාර භාවිතය වඩාත්ම සුදුසු කාණ්ඩයන්ට පමණක් සීමා කිරීමට ප්‍රයත්න දරන ලදී. කෙසේ වුවද, ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ දේශීය මිල ගණන් මත වූ හරස් සහනාධාරය (එනම් පෙට්‍රල් මිල නිෂ්පාදන පිරිවැයට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පැවතීම සහ ඩීසල් හා භූමිතෙල් මිල, පිරිවැයට වඩා පහළ මට්ටමක පැවතීම) 1995 වර්ෂය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

1995 දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය පරිභෝජනය ඉකුත් වසරට වඩා සියයට 10 ක තියුණු වැඩිවීමක් වාර්තා කළේය. මෙම වැඩිවීම, සියළුම වර්ගයේ ඛනිජ තෙල් නිෂ්පාදිත පරිභෝජනය තුලින් දක්නට ලැබිණ. සාපේක්ෂ වශයෙන් අඩු මිල සහ ඉහළ ගිය ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ඩීසල් පරිභෝජනය සියයට 9 කින් වර්ධනය විය. ඉකුත් වසරෙහිදී පැවති සියයට 6 ක වර්ධනයට සාපේක්ෂව 1995 දී පෙට්‍රල් ඉල්ලුමෙහි වර්ධනය සියයට 3 දක්වා පහත වැටුණි. වසරේ මුල් මාස 4 තුලදී පැවති තාප බල උත්පාදනය හේතුවෙන් බැර ඩීසල් භාවිතය සියයට 48 කින් වැඩිවිය. ඉකුත් වසරේදී මෙන්ම 1995 දිද භූමිතෙල් ඉල්ලුම සියයට 7 කින් වර්ධනය විය. පාරිභෝගික පහසුව සහ ඉහළ නගින දර මිල ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් එල්. පී. ගෑස් සඳහා වූ ඉල්ලුම 1995 දී සියයට 20 කින් වැඩි විය.

ඔරුගොඩවත්ත (මෙ.ටො.120,000 හෙවත් ගබඩා පහසුකම් වලින් සියයට 75 ක්) සහ කොලොන්නාව (මෙ.ටො. 65,000 ක් හෙවත් ගබඩා පහසුකම් වලින් සියයට 20 ක්) තෙල් ගබඩා සංකීර්ණයන්ට ගින්නෙන් සිදු වූ අලාභ හානි, සුළු සැපයුම් හිඟයකට හේතු විය. ගබඩා පහසුකම් සහ නිෂ්පාදිතයන් විනාශ වීම නිසා සිදු වූ මුළු අලාභයෙහි වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 900 ක් සහ රුපියල් දශලක්ෂ 835 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

1995 දී ඛනිජ තෙල් සැපයුම් අංශය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා පියවර ගනු ලැබිණ. රුපියල් දශලක්ෂ 80 ක පිරිවැයක් යටතේ තෙල් පිරිපහදුවේ නව යන්ත්‍රාගාරයක් සවි කිරීම පිණිස අනුමැතිය ලබා දුන්නේය. පලාත්බද ඩිපෝ තුළ ගබඩා ටැංකි 13 ක් ඉදි කිරීම පිණිස අවශ්‍ය මූලික පියවර ගනු ලැබිණ. සපුගස්කන්ද පිරිපහදුවේ ධාරිතාව වැඩි කිරීම පිණිස අවශ්‍ය මූලික කටයුතුද ක්‍රියාත්මක කරනු ලැබිණ.

පෞද්ගලික අංශයේ සහභාගිත්වය හා අදාළව ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම් සහ අයිතිය තබාගැනීම සහ ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම් සහ පැවරීම් (BOO/BOT) පදනම යටතේ හම්බන්තොට විශාල තෙල් පිරිපහදුවක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් සැලකිල්ලට භාජනය විය. මේ අතර පෞද්ගලික අංශයේ සහභාගිත්වයේ තවත් ඉදිරි පියවරක් වශයෙන් ලංකා ගෑස් සමාගමේ පාලන හිමිකම් කොටස (මුළු කොටස් වලින් සියයට 51 ක්) ෂෙල් ජාත්‍යන්තර ආයෝජන බී.වී. නෙදර්ලන්ත සමාගමට රුපියල් බිලියන 1.9 ක වටිනාකමට අලෙවි කරන ලදී. මීට අමතරව එල්. පී. ගෑස් ගබඩා පහසුකම් ජාත්‍යන්තර මට්ටමේ ආරක්ෂිත තත්ත්වයට සරිලන පරිදි වැඩි දියුණු කිරීම පිණිස එල්.පී. ගෑස් ගබඩා කිරීමේ සහ බෙදා හැරීම පිණිස ඒකකයක් පිහිටුවීම සඳහා වූ ව්‍යාපෘතියක්ද සලකා බැලිණ.

## 5.6 ප්‍රවාහනය

### ප්‍රවාහන පද්ධතිය

පසුගිය කාලය තුල මාර්ගස්ථ රථවාහන සංඛ්‍යාව නොකඩවා වර්ධනය වූ නමුදු රටෙහි මාර්ග පද්ධතිය බොහෝදුරට නොවෙනස්ව පැවතුනි. ආසන්න වශයෙන් රට තුල කි.මී. 97,377 ක මාර්ග පද්ධතියක් ඇති අතර ඉන් කි.මී. 11,152 ක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේද ඉතිරිය ප්‍රාදේශීය සභා, පළාත්පාලන ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන යටතේද පවතී. 1995 වර්ෂය අවසානයට ජනතාසන්තක බස් සමාගම් 93 ක් සතුව බස්රථ 8,807 ක බස් රථ ඇනියක් පැවැති අතර ඉන් දිනකට සාමාන්‍යයෙන් ධාවනය කරනු ලැබූයේ බස්රථ 4,692 ක් පමණි. මීට අමතරව, පෞද්ගලික බස්රථ ධාවකයන් විසින් 1995 වර්ෂය අවසානයේදී ආසන්න වශයෙන් බස්රථ 12,000 ක් පමණ මගී ප්‍රවාහන කටයුතුවල යොදවා තිබිණි. පසුගිය පස් වසරක කාලය විමර්ශනය කිරීමේදී, සාමාන්‍යයෙන් වර්ෂයකට ලියාපදිංචි කරනු ලැබූ, සියලු කාණ්ඩවලට අයත් රථවාහන සංඛ්‍යාව, යතුරු පැදිද ඇතුළුව සැලකිය යුතු ප්‍රසාරණයක් පිළිබිඹු කරමින් 85,103 ක් පමණ විය. මේ අතර ශ්‍රී ලංකා දුම්රිය සේවය සතුව ප්‍රවාහන උපාංග 1995 වර්ෂය තුලදී නොවෙනස්ව පැවතුණි. 1995 වර්ෂය අවසානයට ශ්‍රී ලංකා දුම්රිය සේවය සතුව බලවේග කට්ටල 134 ක්ද, මගී මැදිරි 1,312 ක්ද, භාණ්ඩ ප්‍රවාහන ගැල් 2,529 ක්ද තිබිණි. කි.මී. 1,982 ක්වූ දුම්රිය මාර්ග පද්ධතියද නොවෙනස්ව පැවතුනි. රට තුල භාණ්ඩ ප්‍රවාහනයෙන් විශාල ප්‍රමාණයක් හසුරුවනු ලබන්නේ පෞද්ගලික ලොරි හිමියන් විසිනි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා දුම්රිය සේවය 1995 වර්ෂය තුලදී භාණ්ඩ ටොන් කි.මී. දශලක්ෂ 148 ක් ප්‍රවාහනය කල අතර එය මුළු භාණ්ඩ ප්‍රවාහනයෙන් ආසන්න වශයෙන් සියයට 6 ක් පමණ වන ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රටේ ප්‍රධාන වරායවල් 4 ක් එනම් කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරේ වරායයන් පාලනය කරනු ලබන අතර රටේ මුහුදු තීරය වටා පිහිටා ඇති ධීවර වරායයන් ගණනාවක් ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### මාර්ග සංවර්ධනය

ජාතික මහාමාර්ග (A සහ B පංතියේ මාර්ග) සංවර්ධනය කිරීමේ සහ නඩත්තු කිරීමේ වගකීම පැවරී ඇති මාර්ග සංවර්ධන අධිකාරිය, මුළු මාර්ග පද්ධතියෙන් දහයෙන් එකක් පමණ (කි.මී. 11,152) නඩත්තු කරනු ලබයි. ඊට අමතරව, වර්ෂය තුළදී පාලම් 3,760 ක්ද, මාර්ග සංවර්ධන අධිකාරිය මගින්

නඩත්තු කෙරුණි. ජාතික මහාමාර්ග වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් මහාමාර්ග සංවර්ධන කටයුතු සඳහා කරන ලද මුළු ආයෝජන ප්‍රමාණය 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 3,610 දක්වා සියයට 23 කින් වැඩි කරන ලදී. කෙසේ වුවද 1995 වර්ෂයේ රුපියල් දශලක්ෂ 191 ක් වූ මාර්ග නඩත්තු වියදම වැඩිවූයේ සියයට 8 කින් පමණි. වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් විදේශ ආධාරද ඇතිව රුපියල් දශලක්ෂ 2,289 ක වියදමින් මාර්ග පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ප්‍රධාන ව්‍යාපෘති 4 ක වැඩකටයුතු නොකඩවා කරගෙන යන ලදී. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද දෙවන මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හෝමාගම සිට රත්නපුර දක්වා මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 1995 වර්ෂයේදී නිම කරන ලද අතර අවිස්සාවේල්ල-හැටන් මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු වලින් සියයට 85 ක් පමණ නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් 6 ක පුනරුත්ථාපන කටයුතු ද 1995 වර්ෂයේදී නිම කරන ලදී. ලෝක බැංකුව විසින් අරමුදල් සපයා ඇති තෙවන මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ ගාල්ල-මාතර මාර්ගය, මාතර-හක්මන මාර්ගය සහ මාතර අකුරැස්ස මාර්ගය ඇතුළුව කි.මී. 220 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩකටයුතු 1995 වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ගම්පහ, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පිහිටි පාලම් 15 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ද වර්ෂය තුළදී නිම කරන ලදී. මේ අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන තෙවන මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල-පේරාදෙණිය, කටුගස්තොට-මාතලේ, පේරාදෙණිය-ගම්පොළ සහ මහනුවර-නැත්තෙකුඹුර යන කි.මී. 81 ක් වන මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීමේ ගිවිසුම් පත්‍ර දැනටමත් ප්‍රදානය කර ඇත. මීට අමතරව මාර්ග කි.මී. 138 ක මතුපිට සකස් කිරීමේ කටයුතු වර්ෂය තුළදී නිම කළ අතර ජපානයේ විදේශීය ආර්ථික සහ සහයෝගිතා අරමුදල මගින් අරමුදල් සැපයූ කාලීන මාර්ග නඩත්තු ව්‍යාපෘතිය යටතේ මාර්ග කි.මී. 4,528 ක් තාර සහ වැලි අතුරා සකස් කරන ලදී.

ඉහත සඳහන් ප්‍රධාන මාර්ග පුනරුත්ථාපන යෝජනාක්‍රම වලට අමතරව වක්කඩුව-බණ්ඩාරගම-කැස්බෑව මාර්ගය, පැලියගොඩ-පුත්තලම මාර්ගයේ පැලියගොඩ සිට කටුනායක දක්වා කොටස, මහනුවර-අස්ගිරිය-මහියාව මාර්ගය, පේරාදෙණිය-හල්ලොලුව මාර්ගය සහ මාලබේ-කඩුවෙල මාර්ගය තැනීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 1995 වර්ෂය තුළදී නොකඩවා ක්‍රියාත්මක විය. මේ අතර බොරැල්ල-මරදාන මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු වර්ෂය තුළදී නිම කරන ලදී. ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර යටතේ දුම්රිය හරස්පාර හරහා පාලමක් සමග බේස්ලයින් මාර්ගය එක් දිසාවකට මාවත් තුන බැගින් වන පරිදි ප්‍රතිනිර්මාණය කිරීමටත්, අමතර මාවත් දෙකක් ඉදි කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා-ජපන් මිත්‍රත්ව පාලම (දෙවන ඊදියර) පුළුල් කිරීමටත් අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. මේ අතර, දකුණු පළාතට දිවෙන විකල්ප මහා මාර්ගයක් තැනීමේ කටයුතු ද, දෙහිවල සහ බම්බලපිටිය අතර කොළඹ සමුද්‍රාසන්න මාවත තැනීමේ කටයුතුද වර්ෂය තුළදී ආරම්භ කරන ලදී.

මුළු මාර්ග පද්ධතියෙන් දහයෙන් එකක් පමණ වන ජාතික මහා මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට ඉහත දැක්වූ ආකාරයේ පරිශ්‍රමයක් දැරුවද, විශේෂයෙන්ම ප්‍රාදේශීය සහ පළාත්පාලන බල ප්‍රදේශවල පිහිටි විශාල ප්‍රමාණයක මාර්ග පද්ධතියක් කාලීන මාර්ග නඩත්තු කටයුතු නොසලකා හැරීමනිසා, අසතුටුදායක තත්ත්වයක පැවතුනි. මාර්ග පද්ධතියේ පවත්නා වත්මන් අසතුටුදායක තත්ත්වය ආර්ථික කටයුතුවල ප්‍රසාරණයට තවදුරටත් ප්‍රබල බාධාවක්ව පවතී. මාර්ගස්ථ රථවාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනය, පවත්නා මාර්ග පද්ධතියේ තදබදය වැඩි වීමට හේතු වී ඇති අතර එය නිෂ්පාදන අලාභ ඇති කිරීමටද සාධක වී ඇත. එහෙයින් පවත්නා මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ නියමිත පරිදි නඩත්තු කිරීමත්, මාර්ගවල රථවාහන තදබදය අඩු කිරීම සඳහා විකල්ප මහා මාර්ග සහ පාලම් තැනීමත් වහා ප්‍රමුඛත්ව දියයුතු කාර්යයන් බවට පත්වී ඇත. පවත්නා රාජ්‍ය මූල්‍ය සීමාවන් යටතේ, මාර්ග පද්ධතිය පුළුල් කිරීමේ කාර්යභාරයේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉතා වැදගත් වනු ඇත. මේ යටතේ, දැනට යෝජිත සමහර මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඉදි කිරීම, මෙහෙයවීම සහ පැවරීම / ඉදි කිරීම, මෙහෙයවීම හා අයිතිය තබා ගැනීම (BOT/BOO) යන ක්‍රම යටතේ පෞද්ගලික අංශයේ ආයෝජකයන් වෙත පැවරීමට සලකා බලාගෙන යනු ලැබේ.

## මගී ප්‍රවාහනය

මගී ප්‍රවාහන අංශයේ පවත්නා විවිධ ව්‍යුහාත්මක සහ කළමනාකරණ දුර්වලතාවයන් එහි වාණිජමය පැවැත්මට බලවත් අභියෝගයක්ව පවතී. පෞද්ගලික බස් මගී ප්‍රවාහන අංශයේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට එහි සුළු බස් හිමියන් රැසක් සිටීම බාධාවක් වී ඇත. එමෙන්ම කළමනාකරණ අකාර්යක්ෂමතාවයන් සහ වැඩිවන යෙදවුම් පිරිවැය හමුවේ බස් ගාස්තු 1990 න් පසු වෙනස් නොකිරීමේ හේතුවෙන් ඔවුන්ගේ ලාභ ආන්තිකයන් හීන වී ඇත. පෞද්ගලික බස් මගී ප්‍රවාහන අංශයෙන් සපයන සේවාවල ගුණාත්මක බව තවදුරටත් අසතුටුදායක තත්ත්වයක පැවැති අතර නිතිරීති ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩුකම් සහ සේවාවේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ආයෝජන නොකිරීම මෙයට හේතු සාධක විය. එමෙන්ම රාජ්‍ය අංශයේ මගී ප්‍රවාහන සේවයෙහි පැවැත්මටද දිගින් දිගටම සිදුවන මූල්‍ය පාඩු බලවත් තර්ජනයක් විය. සුරක්ෂිත, කාර්යක්ෂම සහ විශ්වාස කටයුතු ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා සුදුසු බස් ගාස්තු සංශෝධනයක් සහිතව බස් ප්‍රවාහන අංශයේ වාණිජමය පැවැත්ම ප්‍රකෘතිමත් කිරීමට විවිධ පියවර ගැනීම අවශ්‍ය වී ඇත.

ප්‍රවාහන ගාස්තු හා සම්බන්ධ ගැටළු විභාග කිරීම සඳහා කමිටුවක් (පොදු ප්‍රවාහන ගාස්තු කමිටුව) 1995 මාර්තු මාසයේදී පත් කරන ලදී. මෙම කමිටුව විසින් ප්‍රවාහන මාධ්‍ය මෙහෙයුම් පිරිවැය, මගීන්ට ගාස්තු දැරීමට ඇති හැකියාව, සුදුසු වට්ටම්, ගුණාත්මක වෙනස්කම් සහ පවත්නා ආර්ථික තත්ත්වය ආදිය සැලකිල්ලට ගෙන තාර්කික ගාස්තු ව්‍යුහයක් සකස් කරන ලදී. ඒ අනුව බස් ප්‍රවාහන අංශය සඳහා සියයට 21-40 අතර පරාසයක ගාස්තු වැඩි කිරීමක්ද, දුම්රිය ප්‍රවාහන අංශය සඳහා සියයට 46 ක ගාස්තු වැඩි කිරීමක්ද නිර්දේශ කරන ලදී. කෙසේ වෙතත් කමිටුවේ නිර්දේශ වර්ෂය තුළදී ක්‍රියාත්මක නොකෙරිනි.

මේ අතර, ජනතාසන්තක සමාගම්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් එම සමාගම් ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ සමාගම්වල කළමනාකරණය උසස් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව විසින් නිර්දේශිත ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන යටතේ දැනට පවත්නා සමාගම් 93 ප්‍රාදේශීය සමාගම් 11 ක් ලෙස ඒකරාශී කිරීමට අපේක්ෂිතය.

## බස් ප්‍රවාහනය

1995 වර්ෂය අවසානයට ජනතාසන්තක බස් සමාගම් 93 ක් තිබිණි. මෙම සමාගම්වල බස් රථ ඇතිය ප්‍රසාරණය වීම නිසා ධාවනය කරන ලද මුළු කිලෝ මීටර් ප්‍රමාණය වර්ෂය තුලදී සියයට 14 කින් වැඩිවිය. සියලුම ජනතාසන්තක බස් සමාගම් විසින් දිනකට සාමාන්‍යයෙන් ධාවනය කරන ලද බස්රථ සංඛ්‍යාව 1994 දී වාර්තාවූ 4,207 සමග සැසඳීමේදී 1995 දී 4,692 ක් විය. ප්‍රවාහන සේවා සඳහා වැඩිවෙමින් පවත්නා ඉල්ලුම සනිටුහන් කරමින් ජනතා සන්තක බස් සමාගම්වල මගී ප්‍රවාහන කටයුතු සියයට 24 කින් ඉහළ ගියේය. ජනතාසන්තක සමාගම්වල ආදායම පසුගිය වර්ෂයට වඩා සියයට 21 කින් ඉහළ ගියේය. මීට අමතරව, සහනදායක වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් සහ අලාභ සහිත මාර්ගවල බස් ධාවනය කිරීම වෙනුවෙන් රුපියල් දශලක්ෂ 350 ක මුදලක් රජයෙන් ලැබුනි.

1995 වර්ෂයේදී ජාතික ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා උපාය මාර්ගයන් කිපයක්ම හඳුන්වා දෙන ලදී. අධික ලෙස මගීන් නංවා ගැනීම, අධික වේගයෙන් ධාවනය කිරීම සහ දිගු වේලාවක් බස්රථ එකතැන නවතාගෙන සිටීම වැනි ගැටළු අවම කිරීම සඳහා ජාතික ප්‍රවාහන කොමිෂම මගින් ජනතාසන්තක සහ පෞද්ගලික අංශයේ බස්රථ, ඒකාබද්ධ කාල සටහන් යටතේ ධාවනය කිරීම සංවිධානය කරන ලදී. මේ යටතේ ඌව, උතුරු මැද සහ දකුණු පළාත්වල මාර්ග සඳහා බස් ධාවනය වර්ෂය තුලදී සම්බන්ධීකරණය කරනු ලැබීය. ජාතික ගමනාගමන කොමිෂම දැනට ඇති පහත් පියැසි බස්රථ ධාවනයෙන් ඉවත් කිරීමටත්, බස් රථ සඳහා නව ප්‍රමිතීන් පැණවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

1995 වර්ෂයේදී බස් මගී ප්‍රවාහන සේවා සැපයුමේදී පෞද්ගලික අංශයේ නව ආයෝජන සංඛ්‍යාවේ අඩුවීමක් දක්නට ලැබුනි. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි අළුතින් ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන බස්රථ සංඛ්‍යාව (ජනතාසන්තක සමාගම්වල බස්රථ ද ඇතුළුව) 1994 දී වාර්තා වූ 3,347 සමහ සැසඳීමේදී 1995 දී 1,653 ක් විය. මෙම අඩුවීම, පවත්නා තත්ත්වය යටතේ, පෞද්ගලික මගී ප්‍රවාහන අංශය, ආයෝජකයන්ට තවදුරටත් සිත් ඇදගන්නා සුළු අංශයක් නොවන බව පෙන්නුම් කරයි. බස් ගාස්තු හා අදාළව යෝග්‍ය ගැලපුම් කරනු ලැබුයේ නම් මෙම අංශයෙහි ආයෝජන ප්‍රමාණයෙහි වර්ධනයක් සිදුවිය හැකිව තිබුණි.

## දුම්රිය ප්‍රවාහනය

විමර්ශනයට ලක්වන වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට නොලැබිණි. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කිලෝමීටර් ප්‍රමාණය දශලක්ෂ 8 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. දුම්රිය මගී කිලෝමීටර් ප්‍රමාණය පසුගිය වර්ෂයේදී වැඩි වූ සියයට 14 සමග සැසඳීමේදී 1995 දි වැඩිවූයේ සියයට 6 කිනි. පසුගිය වර්ෂ දෙකේදී නිරීක්ෂණය කරන ලද දුම්රිය භාණ්ඩ ප්‍රවාහනයෙහි අඩුවන ප්‍රවනතාවය තවදුරටත් ක්‍රියාත්මක වෙමින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය සියයට 4 කින් පහත වැටුණි.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වය පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ පසුගිය වසරවල දුම්රිය යටිතල ව්‍යුහය ශක්තිමත් කිරීමට සහ නඩත්තු කිරීමට ප්‍රමාණවත් පරිදි ආයෝජන නොකිරීමය. දුම්රිය මාර්ගවල පවතින අසතුටුදායක තත්ත්වය, අප්‍රමාණවත් දුම්රිය එන්ජින් සංඛ්‍යාව,

**සංඛ්‍යා සටහන 5.7**

**ගමනාගමන අංශයේ මූලික ලක්ෂන 1991 - 1995**

| ශීර්ෂය | ඒකකය | 1991 | 1990 ට වඩා ප්‍රතිශත වෙනස | 1992 | 1991 ට වඩා ප්‍රතිශත වෙනස | 1993 | 1992 ට වඩා ප්‍රතිශත වෙනස | 1994 | 1993 ට වඩා ප්‍රතිශත වෙනස | 1995 (අ) | 1994 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් | | | | | | | | | | | |
| පෞද්ගලික මගී ප්‍රවාහන බස්රථ (ආ) | සංඛ්‍යාව | 2,987 | 178.9 | 2,479 | -17.0 | 1,835 | -26.0 | 3,347 | 82.4 | 1,653 | -50.6 |
| පෞද්ගලික මෝටර්රථ (ඇ) | ,, | 15,076 | -0.4 | 20,177 | 33.8 | 1,6802 | -16.7 | 22,517 | 34.0 | 30,046 | 33.4 |
| මෝටර් බයිසිකල් | ,, | 58,643 | -30.5 | 65,834 | 12.3 | 53,934 | -18.1 | 36,791 | -31.8 | 34,207 | -7.0 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | ,, | 3,200 | 15.3 | 4,146 | 29.6 | 4,948 | 19.3 | 5,213 | 5.4 | 7293 | 39.9 |
| ඉඩම් වාහන | ,, | 4,003 | 49.8 | 5,487 | 37.1 | 6,646 | 21.1 | 7,160 | 7.7 | 9224 | 28.8 |
| වෙනත් | ,, | 76 | 28.8 | 134 | 76.3 | 8 | -94.0 | 34 | 325.0 | 30 | -11.8 |
| පෞද්ගලික බස්රථ | ,, | 272 | 209.1 | 425 | 56.3 | 295 | -30.6 | 476 | 61.4 | 47 | -90.1 |
| 2. ශ්‍රීලංකා දුම්රිය සේවය (ශ්‍රී.ලං.දු.සේ) | | | | | | | | | | | |
| ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 7.6 | 4.1 | 8.1 | 6.6 | 8.2 | 1.2 | 8.0 | -2.4 | 8.0 | - |
| මගී කිලෝමීටර් | ,, | 2,653.4 | -4.6 | 2,613.4 | -1.5 | 2,821.6 | 8.0 | 3,201.7 | 13.5 | 3,404.0 | 6.3 |
| බඩු ටොන් කිලෝමීටර් | ,, | 169.1 | 3.2 | 177.0 | 4.7 | 159.2 | -10.1 | 154.1 | -3.2 | 148.1 | -3.9 |
| මුළු ආදායම් | රු: ද: ලක්ෂ | 808.0 | 18.8 | 885.0 | 9.5 | 820.0 | -7.3 | 916.0 | 11.7 | 947.0 | 3.4 |
| වර්තන වියදම් | ,, | 1,199.0 | 13.4 | 1,239.0 | 3.3 | 1,236.0 | -0.2 | 1,675.0 | 35.5 | 1,735.0 | 3.6 |
| මෙහෙයුම් අලාභය | ,, | 391.0 | 18.0 | 354.0 | -9.5 | 416.0 | 17.5 | 758.0 | 82.2 | 788.0 | 4.0 |
| ප්‍රාග්ධන වියදම් | ,, | 2,595.0 | 105.1 | 1,998.0 | -23.0 | 3,185.0 | 59.4 | 2,584.0 | -18.9 | 3,117.0 | 20.6 |
| සමස්ථ හිඟය | ,, | 2,986.0 | 80.3 | 2,352.0 | -21.2 | 3,601.0 | 55.1 | 3,342.0 | -7.2 | 3,905.0 | 16.8 |
| 3. ප්‍රාදේශීය බස් සමාගම් | | | | | | | | | | | |
| ධාවන කිලෝමීටර් | දශ ලක්ෂ | 247.0 | 0.7 | 268.1 | 8.5 | 272.2 | 1.5 | 306.7 | 12.6 | 351.1 | 14.5 |
| මගී කිලෝමීටර් | ,, | 11,454.0 | -14.1 | 12,840.0 | 12.1 | 13,608.0 | 6.0 | 15,613.1 | 14.7 | 19,361.0 | 24.0 |
| මුළු ආදායම් | රු. ද. ලක්ෂ | 2,761.0 | 5.5 | 2,737.0 | 0.9 | 3,043.7 | 11.2 | 3,593.5 | 18.1 | 4,339.5 | 20.8 |

(අ) තාවකාලික
(ආ) ප්‍රාදේශීය බස් සමාගම් වල ලියා පදිංචි කරන ලද බස් රථද ඇතුලත්ය.
(ඇ) ද්වීත්ව කාර්ය වාහන ඇතුලත් වේ.

මූලයන් : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
ජාතික ප්‍රවාහන කොමිෂම

පවත්නා දුම්රිය එන්ජින් අබලන් වීම සහ යල් පැනගිය සන්නිවේදන හා සංඥා ක්‍රමයන් දුම්රිය සේවයේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපාන ලද අතර සේවයේ ගුණාත්මක බව අඩු කිරීමටද හේතුවිය. අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වය හේතුකොටගෙන, පිළිවෙලින් ලටවන වර්ෂයටද, වඩාත් ලාභදායක උතුරු මාර්ගයෙහි දුම්රිය ධාවනය සිදු නොවිණි. වර්ෂය තුලදී, උතුරු මාර්ගයෙහි නාන්ඩිකුලම දුම්රිය ස්ථානයෙන් ඔබ්බටද, තලෙයිමන්නාරම මාර්ගයේද දුම්රිය ධාවන කටයුතු සිදු නොවූ අතර ත්‍රිකුණාමලය - මඩකලපුව දුම්රිය සේවයටද බාධා පැමිනුණි.

දුම්රිය සේවය තවදුරටත් පිරිහීම වළක්වා ගැනීම සඳහා වර්ෂය තුලදී දුම්රිය මාර්ග, බලවේග කට්ටල සහ ප්‍රධාන දුම්රිය වැඩබිම් පුනරුත්ථාපනය කිරීම සඳහා ජපානයේ විදේශ ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ඇතිව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී. දුම්රිය මැදිරිවල අධික මගී තදබදය මහහැරීම සඳහා රොමේනියානු මගී මැදිරි, ඩීසල් එන්ජින්වලට සම්බන්ධ කළහැකි වන පරිදි නවීකරණය කර, මගින් වැඩි පිරිසකට ගමන් කිරීමට ඉඩකඩ සලසා දෙන ලදී. පාලම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ කළුතර සහ පානදුර දුම්රිය පාලම් පුනරුත්ථාපනය කිරීම සඳහා වර්ෂය තුළදී මූලික පියවර ගනු ලැබිය. වටවල දුම්රිය මාර්ගය කිඳ බැසීම වැළැක්වීම සඳහා ස්ථිර පිළියම් යෙදූ අතර එමනිසා සාමාන්‍ය සේවාවන් සඳහා වූ බාධාවන් ඉවත් විය. ඊට අමතරව කොන්ක්‍රීට් සහ දැවයෙන් තැනූ සිල්බර 173,251 ක් යෙදීමෙන් දුම්රිය මාර්ගවල තත්ත්වය වැඩිදියුණු කරන ලද අතර එමගින් එතෙක් පනවා තිබූ වේග සීමා ගණනාවක් ඉවත් කිරීමටද හැකිවිය. කැළණිවැලි දුම්රිය මාර්ගයේ සේවා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා පාදුක්ක සිට අවිස්සාවේල්ල දක්වා මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වර්ෂය තුලදී කරගෙන යන ලදී.

අධික මෙහෙයුම් අලාභ හේතුකොටගෙන ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් පිරිහිණි. ප්‍රවාහන ගාස්තු නොවෙනස්ව පැවැතීම සහ පහත වැටුනු ධාවන කටයුතුවල ප්‍රතිඵල ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ආදායම රුපියල් දශලක්ෂ 947 දක්වා සියයට 3 කින් පමණක් වර්ධනය වූ අතර ප්‍රධාන වශයෙන් අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඉහළයාමේ හේතුවෙන් 1995 දී වර්තන වියදම රුපියල් දශලක්ෂ 1,735 දක්වා සියයට 4 කින් වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය 1994 දී රුපියල් දශලක්ෂ 758 සිට 1995 දී රුපියල් දශලක්ෂ 788 දක්වා වැඩිවිය. ප්‍රාග්ධන වියදම් ද ඇතුළුව, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සමස්ත මූල්‍ය හිඟය 1995 දී රුපියල් දශලක්ෂ 3,905 ක් විය.

සංඛ්‍යා සටහන 5.8

## වරාය සේවා ක්‍රියාකාරිත්වය 1991 - 1995

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) | ප්‍රතිශත වෙනස 1994 | ප්‍රතිශත වෙනස 1995 |
|---|---|---|---|---|---|---|---|
| 1. ආයෝජන කරන ලද ප්‍රාග්ධනය (රුපියල් දශලක්ෂ) | 13,409 | 14,411 | 17,352 | 20,806 | 25,231 | 20 | 21 |
| 2. පැමිණි නැව් සංඛ්‍යාව | 3,415 | 3,961 | 4,345 | 4,294 | 4,169 | -1 | -3 |
| කොළඹ | 3,076 | 3,624 | 3,887 | 3,790 | 3,611 | -2 | -5 |
| ගාල්ල | 142 | 74 | 210 | 223 | 253 | 6 | 13 |
| ත්‍රිකුණාමලය | 197 | 263 | 248 | 281 | 305 | 13 | 9 |
| 3. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ:ටො '000) | 13,691 | 13,331 | 16,498 | 18,097 | 19,517 | 10 | 8 |
| කොළඹ | 12,283 | 11,957 | 14,712 | 16,143 | 17,414 | 10 | 8 |
| ගාල්ල | 219 | 236 | 255 | 303 | 237 | 19 | -22 |
| ත්‍රිකුණාමලය | 1,189 | 1,139 | 1,531 | 1,651 | 1,866 | 8 | 13 |
| 4. බහාලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) | 669 | 676 | 858 | 973 | 1,049 | 13 | 8 |
| කොළඹ | 669 | 676 | 858 | 973 | 1,049 | 13 | 8 |
| ගාල්ල | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - |
| 5. අන්තර් නැව් බහාලුම් ප්‍රමාණය (TEUs '000) | 470 | 451 | 591 | 666 | 700 | 13 | 5 |
| කොළඹ | 470 | 451 | 591 | 666 | 700 | 13 | 5 |
| ගාල්ල | - | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - |
| 6. ආදායම (රු. දශ ලක්ෂ) | 3,752 | 4,031 | 4,931 | 5,197 | 6,820 | 5 | 31 |
| කොළඹ | 3,609 | 3,872 | 4,737 | 4,964 | 6,581 | 5 | 33 |
| ගාල්ල | 51 | 50 | 64 | 90 | 72 | 41 | -20 |
| ත්‍රිකුණාමලය | 92 | 109 | 130 | 143 | 163 | 10 | 14 |
| 7. වියදම (රු. දශ ලක්ෂ) | 2,715 | 3,093 | 3,982 | 4,670 | 5,460 | 17 | 17 |
| කොළඹ | 2,529 | 2,888 | 3,717 | 4,394 | 5,129 | 18 | 17 |
| ගාල්ල | 67 | 73 | 93 | 107 | 127 | 15 | 19 |
| ත්‍රිකුණාමලය | 118 | 131 | 171 | 169 | 203 | -1 | 20 |
| 8. ශුද්ධ ලාභය බදු ගෙවීමට පෙර(රු. දශ ලක්ෂ) | 1,037 | 938 | 949 | 527 | 1,360 | -44 | 158 |
| කොළඹ | 1,078 | 984 | 1,020 | 569 | 1,452 | -44 | 155 |
| ගාල්ල | -17 | -23 | -30 | -17 | -52 | -43 | 206 |
| ත්‍රිකුණාමලය | -26 | -22 | -41 | -25 | -40 | -39 | 60 |
| 9. සේවක සංඛ්‍යාව | 18,312 | 17,843 | 17,345 | 16,910 | 16,492 | -3 | -2 |
| කොළඹ | 16,486 | 16,181 | 15,844 | 15,409 | 14,851 | -3 | -4 |
| ගාල්ල | 701 | 656 | 634 | 634 | 779 | 0 | 23 |
| ත්‍රිකුණාමලය | 1,125 | 1,056 | 867 | 867 | 862 | 0 | -1 |

(අ) තාවකාලික TEUs : අඩි 20 ට සමාන බහාලුම් ඒකක

මූලයන් : ශ්‍රී ලංකා වරාය අධිකාරිය.

දුම්රිය සේවය සම්බන්ධ වත්මන් ප්‍රතිපත්ති ක්‍රමෝපාය යොමුවී ඇත්තේ ශ්‍රී ලංකා දුම්රිය සේවය වාණිජ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම කෙරෙහිය. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වාණිජ නැඹුරුවක් සහිත කළමනාකරණ රාමුවක් ඇති කිරීම සහ අලෙවිය, මෙහෙයුම්, ගාස්තු සහ මානව සම්පත් සම්බන්ධ පිළිවෙත් නිසි පරිදි සැකසිය යුතු බවට ලෝක බැංකුව විසින් කල අධ්‍යයනයකදී යෝජනා කර ඇත. නගරබද දුම්රිය මාර්ග, විදුලි දුම්රිය මාර්ග බවට පරිවර්තනය කිරීම BOO සහ BOT පදනම යටතේ සලකා බලනු ලැබේ.

## වරාය සේවා

අපනයනය පෙරටු කරගත් ආර්ථික වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන වරාය පද්ධතිය සංවර්ධනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරේ.

කොළඹ වරාය, කලාපයේ කේන්ද්‍රීය වරායක් ලෙස, නවීන පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති කිපයක් ආරම්භ කරන ලදී. 'ජය' බහාලුම් පර්යන්තයේ තෙවන අදියරේ සංවර්ධන කටයුතු 1995 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර ඒ යටතේ පැරාමැක්ස් නාවික යාත්‍රා හැසිරවීමට අවශ්‍ය උපකරණ ස්ථාපිත කිරීමටත්, වාර්ෂික බහාලුම් භාණ්ඩ හැසිරවීමේ ධාරිතාව අඩි විස්සට සමාන බහාලුම් ඒකක (TEU) 350,000 කින් වැඩි කිරීමටත් අපේක්ෂිතය. විශාල නැව් වරායට ඇතුළු වීමට පහසුකම් සැලසෙන පරිදි ජලමාර්ගය මීටර් 15 ක් දක්වා ගැඹුරු කිරීම සහ වරායට ඇතුළුවන ප්‍රධාන ජල මාර්ගය පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මීට අමතරව, BOO සහ BOT ක්‍රම යටතේ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් ගාල්ල වරාය සංවර්ධනය කිරීමට රජය තිරණය කර ඇති අතර ඒ සම්බන්ධයෙන් දැනටමත් පියවර කිපයක් ගනු ලැබ ඇත.

කොළඹ, ගාල්ල සහ ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායයන් තුනෙහිදී හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 10 ක වර්ධනය සමග සැසඳීමේදී 1995 වර්ෂයේදී සියයට 8 ක වර්ධනයක් වාර්තා කරමින් මෙ.ටොන් දශලක්ෂ 19.5 ක් විය. මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් සියයට 90 ක් හෙවත් මෙ.ටොන් දශලක්ෂ 17.4 ක් හසුරුවන ලද්දේ කොළඹ වරායේදීය. 1995 දී ශ්‍රී ලංකාවේ වරායයන් වෙත පැමිණි නාවික යාත්‍රා ප්‍රමාණය 4,169 දක්වා සියයට 3 කින් අඩුවිය. 1995 වර්ෂයේදී කොළඹ වරායේදී හසුරුවන ලද බහාලුම් ප්‍රමාණය ඒකක දශලක්ෂයක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 8 ක වැඩිවීමක් වාර්තා කළේය. හැසිර වූ මුළු බහාලුම් ප්‍රමාණයෙන් සියයට 67 ක් නැව් අතර බහාලුම් හුවමාරු කිරීම් වලට අයත් වේ. කොළඹ වරායේ මුළු භාණ්ඩ හැසිරවීම් වලින් සියයට 67 ක් බහාලුම්ගත ඒවා විය.

වරාය සේවාවල මුළු වියදම් 1994 වර්ෂයට වඩා සියයට 17 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 5,460 ක් විය. මුළු වියදමින් සියයට 94 ක් (රුපියල් දශලක්ෂ 5,129 ක්) කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු සඳහා විය. මේ අතර මුළු ආදායම වූ රුපියල් දශලක්ෂ 6,820 (මින් රුපියල් දශලක්ෂ

**සංඛ්‍යා සටහන 5.9**

**මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගාකල අළුත් ඉඩම් ප්‍රමාණය.**

(හෙක්ටයාර)

| ශීර්ෂය | මහ 1992/93 | යල 1993 | එකතුව 1993 | මහ 1993/94 | යල 1994 | එකතුව 1994 | මහ 1994/95 (අ) | යල 1995 (අ) | එකතුව 1995 (අ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 'එච්' කලාපය | 33,390 | 11,660 | 45,050 | 33,481 | 22,996 | 56,477 | 33,025 | 18,841 | 51,866 |
| වී | 29,117 | 2,291 | 31,408 | 29,950 | 11,205 | 41,155 | 31,228 | 11,330 | 42,558 |
| අනෙකුත් බෝග | 4,273 | 9,369 | 13,642 | 3,531 | 11,791 | 15,322 | 1,797 | 7,511 | 9,308 |
| 'බී' කලාපය | 13,591 | 12,594 | 26,185 | 20,174 | 17,908 | 38,082 | 16,083 | 12,371 | 28,454 |
| වී | 12,513 | 11,956 | 24,469 | 18,321 | 16,007 | 34,328 | 13,792 | 11,537 | 25,329 |
| අනෙකුත් බෝග | 1,078 | 638 | 1,716 | 1,853 | 1,901 | 3,754 | 2,291 | 834 | 3,125 |
| 'සී' කලාපය | 21,521 | 19,976 | 41,497 | 23,868 | 20,148 | 44,016 | 24,926 | 20,561 | 45,487 |
| වී | 19,289 | 19,089 | 38,378 | 20,256 | 19,427 | 39,683 | 20,812 | 19,485 | 40,297 |
| අනෙකුත් බෝග | 2,232 | 887 | 3,119 | 3,612 | 721 | 4,333 | 4,114 | 1,076 | 5,190 |
| 'ජී' කලාපය | 5,414 | 3,732 | 9,146 | - | - | - | 5,553 | 4,961 | 10,514 |
| වී | 5,096 | 2,269 | 7,365 | - | - | - | 5,177 | 3,852 | 9,029 |
| අනෙකුත් බෝග | 318 | 1,463 | 1,781 | - | - | - | 376 | 1,109 | 1,485 |
| 'එල්' කලාපය | 1,095 | 82 | 1,177 | 1,135 | 148 | 1,283 | 961 | 146 | 1,107 |
| වී | 684 | 42 | 726 | 705 | 139 | 844 | 704 | 112 | 816 |
| අනෙකුත් බෝග | 411 | 40 | 451 | 430 | 9 | 439 | 257 | 34 | 291 |
| එකතුව | 75,011 | 48,044 | 123,055 | 78,658 | 61,200 | 139,858 | 80,548 | 56,880 | 137,428 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

සංඛ්‍යා සටහන 5.10

## මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පවුල් පදිංචි කිරීම.

("එච්", "සී", "බී", "ජී" සහ "එල්" කලාප)

පවුල් සංඛ්‍යාව

| වර්ෂය | කලාපය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | "එච්" | "සී" | "බී" | "ජී" | "එල්" | |
| 1976 | 2,383 | - | - | - | - | 2,383 |
| 1977 | 3,141 | - | - | - | - | 3.141 |
| 1978 | 2,754 | - | - | - | - | 2,754 |
| 1979 | 5,290 | - | - | - | - | 5,290 |
| 1980 | 7,407 | - | - | - | - | 7,407 |
| 1981 | 2,389 | 2,777 | - | - | - | 5,166 |
| 1982 | 1,449 | 2,683 | 1,918 | - | - | 6,050 |
| 1983 | 1,077 | 1,988 | 1,938 | 1,319 | - | 6,322 |
| 1984 | 1,956 | 1,992 | 1,381 | 446 | - | 5,775 |
| 1985 | 44 | 823 | 3,423 | 1,045 | - | 5,335 |
| 1986 | 780 | 2.151 | 1.260 | 583 | - | 4.774 |
| 1987 | 182 | 1,407 | 857 | 274 | - | 2.720 |
| 1988 | 14 | 1.081 | 656 | 85 | 3,270 | 5.106 |
| 1989 | 9 | 1,008 | 324 | 1,305 | 94 | 2.740 |
| 1990 | 1,680 | 3.427 | 3,492 | 366 | - | 8.965 |
| 1991 | 1,151 | 3.240 | 1.468 | 126 | - | 5.985 |
| 1992 | 754 | 2.005 | 1.716 | 6 | - | 4.481 |
| 1993 | 283 | 1.500 | 3,190 | - | - | 4.973 |
| 1994 | 30 | 332 | 841 | - | - | 1.203 |
| 1995(අ) | - | 68 | 132 | - | - | 200 |
| එකතුව | 32,773 | 26,482 | 22,596 | 5,555 | 3,364 | 90,770 |

(අ) තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

සංඛ්‍යා සටහන 5.11

## තෝරාගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා වූ වියදම්.

| | ව්‍යාපෘතිය | ආධාර ලබාගත් මූලාශ්‍රය | මුළු විදේශ විනිමය ලැබීම් (දශලක්ෂ) | 1994 වියදම (රු. දශලක්ෂ) | 1995 (අ) වියදම (රු. දශලක්ෂ) | 1995 (අ) අවසානය දක්වා සමුච්චිත වියදම (රු. දශලක්ෂ) |
|---|---|---|---|---|---|---|
| 1. | කිරිදිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය පියවර 11 | ආ.සං.බැං. (එස් ඩී ආර්) | 22 | 60 | - | 691 |
| 2. | මිනිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්තාපන ව්‍යාපෘතිය | ජපානය (යෙන්) | 1850 | 190 | 98.6 | 514.6 |
| 3. | වයඹ පලාතේ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය | යුරෝපීය ප්‍රජාවගේ කොමිසම (ඊ.සී.යූ) | 6.3 | 22.8 | 45.3 | 168.1 |
| 4. | ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | අයි.ඩී.ඒ. (රුපියල්) | 1,406.9 | 157.4 | 265.0 | 613.0 |
| | | සී. ඊ. සී (රුපියල්) | 1,622.6 | | | |

(අ) තාවකාලික

මූලය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

6,581 ක් කොළඹ වරායෙන් ලැබූ ආදායම වේ) පෙර වර්ෂයේ ආදායමට වඩා සියයට 31කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1995 වර්ෂයේ ශුද්ධ ලාභය සැලකිය යුතු ලෙස සියයට 158 කින් වර්ධනය වී රුපියල් දශලක්ෂ 1,360 ක් බවට පත්විය. අන්තර් නැව් බහාලූම් ගාස්තු වැඩිකිරීම මෙම වර්ධනයට ආංශික වශයෙන් හේතු විය. ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායයන් මෙහෙයුම් අලාභ වාර්තා කළේය.

## 5.7 වාරිමාර්ග සහ ජනාවාස

රටේ මෙතෙක් ආරම්භ කරන ලද විශාලතම වාරිමාර්ග සහ ජනාවාස යෝජනාක්‍රමය වන මහවැලි වැඩපිළිවෙල 1995 වර්ෂය තුලදීද දිගටම ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අනුව වර්ෂය තුලදී මහවැලි වැඩසටහන් සඳහා කරන ලද මුළු වියදම රුපියල් දශලක්ෂ 1,802 කි. 1994/95 වගා වර්ෂයේදී මහවැලි බල ප්‍රදේශය තුල වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 137,428 ක් විය. මෙම බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 118,029 ක් වී වගාව යටතේ වූ අතර ඉතිරි හෙක්ටයාර 19,399 වෙනත් ආහාර භෝග වගා යටතේ විය.

මීට අමතරව, වෙනත් ප්‍රධාන වාරිමාර්ග වැඩසටහන් 3 ක, එනම් මිණිපේ - නාගදීප වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනාක්‍රමය, වයඹ විශේෂ වාරිමාර්ග යෝජනාක්‍රමය සහ ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනාක්‍රමය යන යෝජනාක්‍රම වල වැඩකටයුතු 1995 වර්ෂයේදී ද දිගටම ක්‍රියාත්මක කළ අතර අවසානයේ සඳහන් කළ යෝජනා ක්‍රම

දෙකෙහි වැඩකටයුතු වර්ෂය තුළදී අවසන් කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තාවකාලික දත්තවලට අනුව ඉහත යෝජනා ක්‍රම සඳහා 1995 වර්ෂයේදී වැය කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 379 ක් විය. කිරිඳිඔය වාරිමාර්ග සහ ජනපද ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි වැඩකටයුතු වර්ෂය තුළදී ක්‍රියාත්මක නොවූ අතර එහෙයින් මෙම කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් වැය කිරීම් සිදු නොවුණි. වයඹ විශේෂ වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 814 ක් සඳහා පහසුකම් සපයන ලද අතර පවුල් 948 ක් පදිංචි කරවන ලදී. මේ අතර නිල බැම්ම ව්‍යාපෘතිය, තුත්තනෝරිය වැව සහ ගල්කුඹුර වේල්ල වැනි උප ව්‍යාපෘති 9 කද වැඩකටයුතු නිම කරන ලදී. ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ ආසන්න වශයෙන් ඉඩම් හෙක්ටයාර 3,800 කට පහසුකම් සලසන ලදී.

වාරිමාර්ග ජනාවාස පිහිටුවීමේ යෝජනාක්‍රම යටතේ, පසුගිය වර්ෂවල ගොවි පවුල් සහ ගොවි නොවන පවුල් පදිංචි කරවීම මහවැලි ප්‍රදේශවලට සහ උඩවලවේ වම් සහ දකුණු ඉවුරු ප්‍රදේශයට පමණක් සීමාවිය. වර්ෂය තුළදී උඩවලවේ ප්‍රදේශයේ පදිංචි කරන ලද මුළු පවුල් සංඛ්‍යාව 2,812 ක් වූ අතර ඉන් පවුල් 277 ක් ගොවි පවුල්ද, ඉතිරිය ගොවි නොවන පවුල් ද විය. වර්ෂය තුළදී මහවැලි ප්‍රදේශවල පදිංචි කළ පවුල් සංඛ්‍යාව, මහවැලි "ඊ" කලාපයේ පවුල් 132 ක්ද, "සී" කලාපයේ පවුල් 68 ක්ද වූ අතර ඒ අනුව මහවැලි වැඩපිළිවෙල යටතේ පදිංචි කරන ලද මුළු පවුල් සංඛ්‍යාව 90,770 ක් දක්වා වැඩි විය. මහවැලි වැඩපිළිවෙල යටතේ පදිංචි කළ පවුල් ප්‍රමාණය 1993 දී 4,973 සිට 1994 දී 1,203 දක්වා අඩු වූ අතර එම ප්‍රමාණය 1995 දී 200 දක්වා තවදුරටත් අඩුවිය.

## 5.8 විශේෂ වැඩසටහන්

### නිවාස

නිවාස සංවර්ධනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය මූලික ප්‍රවේශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. පළමුවැන්න නම් අඩු ආදායම් ලබන පවුල්වලට සිය හැකියාවන් පදනම් කරගෙන නව නිවාස ඉදිකිරීමට හෝ දැනට ඇති නිවාස වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය ආධාර සපයා දීමයි. දෙවැන්න නම් නිවාස ඉදිකිරීම් මූල්‍යයනය කිරීමේ ක්‍රම ශක්තිමත් කර, මූල්‍ය ආයතන නිවාස සංවර්ධනය සඳහා සක්‍රිය ණය දෙන ආයතන ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කර දීමයි.

**5.12 සංඛ්‍යා සටහන**

**නව නිවාස වැඩ සටහන**

| උප - වැඩ සටහන | ණය ලබාගත් පවුල් සංඛ්‍යාව | නිම කල ඒකක සංඛ්‍යාව | මුදාහරින ලද ප්‍රමාණය (රු. දශලක්ෂ) |
|---|---|---|---|
| ඡන්ද කොට්ඨාශයකට නිවාස 100 බැගින් | 10,932 | 1,574 | 104,8 |
| ග්‍රාමීය නිවාස වැඩසටහන | 11,941 | 3,897 | 60,3 |
| නාගරික නිවාස වැඩසටහන | 1,676 | 538 | 10,6 |
| වතු නිවාස වැඩසටහන | 1,410 | 48 | 7,4 |
| ආපදා නිවාස වැඩසටහන | 1,047 | 5,155 | 48,7 |
| සෘජු ඉදිකිරීම් වැඩසටහන | 323 | 323 | 154,4 |
| එකතුව | 27,329 | 11,535 | 386,2 |

මූලය: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධනය පිළිබඳ පුරෝගාමී ආයතනය වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට (ජා.නි.ස.අ.) 1995 දී ආරම්භ කරන ලද "නව නිවාස සංවර්ධන වැඩසටහන" ක්‍රියාත්මක කිරීමේ බලය පැවරුණු අතර නිවාස පහළොස් ලක්ෂයක් තැනීමේ වැඩසටහන යටතේ එතෙක් ආරම්භ කර තිබූ ඉදිකිරීම් අවසන් කිරීමේ කටයුතුද පැවරුණි. වර්ෂය තුළදී, නිවාස 15 ලක්ෂයක් තැනීමේ වැඩසටහන යටතේ නව ආයෝජන නොකරන ලද මුත් එම වැඩපිළිවෙල යටතේ පෙර ආරම්භ කරන ලද ව්‍යාපෘති නව නිවාස සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ 1995 වර්ෂය තුළදීද ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ව්‍යාපෘති නම්; එක් ඡන්ද කොට්ඨාශයක් සඳහා නිවාස 100 ක් තැනීමේ වැඩසටහන, නාගරික නිවාස වැඩසටහන, ග්‍රාමීය නිවාස වැඩසටහන, වතු නිවාස වැඩසටහන සහ ආපදා නිවාස වැඩසටහනයි.

විමර්ශනය කරනු ලබන වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධන වැඩසටහන්වල, විශේෂයෙන්ම ග්‍රාමීය නිවාස, නාගරික නිවාස සහ ආපදා නිවාස වැඩසටහන්වල, ක්‍රියාකාරිත්වයේ පහළ වැටීමක් වාර්තා විය. නිවාස තැනීම සඳහා පහසුකම් ලද පවුල් සංඛ්‍යාව අනුව සලකාබැලූ කළ ග්‍රාමීය නිවාස වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වය සියයට 50 කින් පමණ පහත වැටිණි. මෙම ප්‍රවනතාවයම පෙන්නුම් කරමින් නිම කල නිවාස ඒකක සංඛ්‍යාවද, නිවාස 15 ලක්ෂයක් තැනීමේ ව්‍යාපෘතිය යටතේ නිම කළ නිවාස සංඛ්‍යාවද ඇතුලත්ව, ඒකක 11,493 දක්වා සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් තියුණු ලෙස පහත වැටිණි. එමෙන්ම, ග්‍රාමීය නිවාස වැඩසටහන යටතේ මුදා හරින ලද ණය සහ දීමනාවල වටිනාකමද, 1994 දී රුපියල් දශලක්ෂ 230 සිට 1995 දි රුපියල් දශලක්ෂ 94 දක්වා අඩුවිය. මීට සමාන උපනතියක් පිළිබිඹු කරමින් නාගරික නිවාස වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වයද 1995 වර්ෂයේදී සැලකියයුතු ලෙස පහත වැටිණි. නාගරික නිවාස වැඩසටහන යටතේ සේවාවන් ලද පවුල් සංඛ්‍යාව 1,676 දක්වා සියයට 62 කින් පහත වැටුණු අතර නිවාස 15 ලක්ෂයේ වැඩසටහන යටතේ නිම කරන ලද නිවාසද ඇතුලත්ව, නිම කල මුළු නිවාස ඒකක සංඛ්‍යාව 1994 දී 4,480 සිට 1995 දී 1,723 දක්වා අඩුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික නිවාස වැඩසටහන යටතේ මුදා හරින ලද ණය මුදල්වල වටිනාකමද 1994 දී රුපියල් දශලක්ෂ 77 සිට 1995 දී රුපියල් දශලක්ෂ 16 දක්වා විශාල අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන ආපදා නිවාස වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වයේ පිරිහීමක්ද සලකා බැලෙන වර්ෂය තුළදී දක්නට ලැබිණි. මෙම වැඩසටහන යටතේ පහසුකම් සලසන ලද පවුල් සංඛ්‍යාව 1994 දී 9,758 සිට 1995 දී 1,047 දක්වා අඩුවිය. එමෙන්ම, නිම කරන ලද නිවාස ඒකක සංඛ්‍යාවද 1994 දී 10,109 සිට 1995 දී 5,155 දක්වා පහත වැටිණි. නිවාස සංවර්ධන වැඩසටහන්වල පසුබෑමට සාධක කිපයක් බලපෑවේය. ප්‍රථමයෙන්, නිවාස තැනීම සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීම සහ පවරා ගැනීම් පිළිබඳ ප්‍රශ්න මත නව නිවාස යෝජනාක්‍රමය ආරම්භ කිරීම පමාවිය. දෙවනුව, වර්ෂයේ දෙවන භාගයේදී අත්දකින්නට ලැබූ සිමෙන්ති හිඟය ඉදිකිරීම් කටයුතු සීමා කිරීමට තරමක් දුරට හේතු විය. අවසාන වශයෙන්, ලබාගත හැකි අරමුදල්වල හිඟකම රාජ්‍ය අංශයේ නිවාස සංවර්ධන වැඩසටහන්වල ක්‍රියාකාරිත්වයට අවහිරයක් විය.

1995 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද එක් මැතිවරණ කොට්ඨාශයක් සඳහා නිවාස 100 ක් තැනීමේ

වැඩසටහන යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක හැර දිප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම සඳහා පවුල් 10,932 කට ආධාර සපයන ලද අතර ඉන් පවුල් 1,574 ක් ඔවුන්ගේ නිවාස ඒකක ඉදිකිරීම් 1995 වර්ෂය තුලදී නිම කරන ලදී. මේ සම්බන්ධයෙන් වර්ෂය තුලදී වැය කරන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 105 කි. මේ අතර රුපියල් දශලක්ෂ 154 ක වියදමින් නාගරික පහළ මධ්‍යම ආදායම් ලබන පවුල් සඳහා තට්ටු නිවාස ඒකක 323 ක ඉදිකිරීම් කටයුතුද නිම කරන ලදී. 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 211 ක වියදමින් මෙවැනි නිවාස ඒකක 284 ක් නිම කරන ලදී.

වතු නිවාස වැඩසටහන යටතේ නුවරඑළිය, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල පදිංචි පවුල් 1,410 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය, නිවසක් තැනීමට සුදුසු ඉඩම් හෝ නිවාස ණය මුදලක් වැනි ආධාර ලබා දීමට සුදුසු අය වශයෙන් හඳුනාගෙන තිබුණි. මෙම වැඩසටහන යටතේ විමර්ශනයට ලක්වූ වර්ෂය තුලදී නිවාස ඒකක 48 ක ඉදිකිරීම් කටයුතු නිම කර තිබූ අතර රුපියල් දශලක්ෂ 7.4 ක ණය මුදල් මුදා හැර තිබුණි

මේ අතර වතු නිවාස හා සමාජ සුභසාධන භාරය සහ මහවැලි ආර්ථික ඒජන්සිය වැනි වෙනත් ආයතන විසින් ද වර්ෂය තුලදී නිවාස සංවර්ධන වැඩසටහන් ස්වාධීනව ක්‍රියාත්මක කරන ලදී. වතු නිවාස හා සමාජ සුභසාධන භාරය විසින් සපයන ලද ආධාර මත නිම කරන ලද සහ වැඩිදියුණු කරන ලද නිවාස ඒකක සංඛ්‍යාව අපේක්ෂිත ප්‍රමාණයට වඩා බොහෝදුරට අඩුවිය. ඊට ප්‍රධානතම හේතුව වූයේ මෙම වැඩසටහනට සහභාගි වූවන්ට ස්වශක්තිය මත පදනම් වූ ආධාර ලබා දීමේ මෙවැනි වැඩසටහන් පිළිබඳ අත්දැකීම් අඩුකමයි. කෙසේ වෙතත් 1995 දී මෙම වැඩසටහන යටතේ නව නිවාස ඒකක 136 ක් ඉදිකළ අතර, ඒකක 95 ක් වැඩිදියුණු කරන ලදී. 1994 වර්ෂයේදී, මේ යටතේ නව නිවාස ඒකක 182 ක් ඉදිකරනු ලැබූ අතර ඒකක 372 ක් වැඩිදියුණු කරනු ලැබීය. මහවැලි ආර්ථික ඒජන්සිය විසින් 1994 වර්ෂයේදී නිම කරන ලද නිවාස ඒකක 2,225 සමග සැසඳීමේදී විමර්ශනයට භාජනය වන වර්ෂය තුලදී මහවැලි "බී", "සී", "ජී", "එච්" සහ "එල්" කලාපවල නිමකරන ලද නිවාස ඒකක සංඛ්‍යාව 1,189 කි

පසුගිය වර්ෂයේදී මෙන්ම, රාජ්‍ය වාණිජ බැංකු, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ සමූපකාර ග්‍රාමීය බැංකු විසින් දිවයින පුරා නිවාස ණය ලබාදීම නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් මුදා හරින ලද නිවාස ණය සංඛ්‍යාව 6,463 දක්වා සියයට 46 කින් වර්ධනය වූ අතර, මුදා හරින ලද ණය මුදල්වල වටිනාකම රුපියල් දශලක්ෂ 875 දක්වා සියයට 16 කින් වර්ධනය විය. මේ අතර මහජන බැංකුව විසින් නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් සංඛ්‍යාව 1994 දී 9,189 සිට 1995 දි 16,026 දක්වා තියුණු ලෙස වැඩි වූ අතර, ප්‍රදානය කළ නිවාස ණයවල වටිනාකම 1994 දී රුපියල් දශලක්ෂ 335 සිට 1995 දි සිට රුපියල් දශලක්ෂ 690 දක්වා දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. නිවාස ණය ලබාදීමේ ප්‍රධාන මූලයක් වන සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් රුපියල් දශලක්ෂ 555 ක වටිනාකමින් යුත් ණය පහසුකම්, නිවාස ණය අයදුම්කරුවන් 4,539 කට ප්‍රදානය කරන ලදී. මේ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1994 දි නිවාස ණයලාභීන් 1,022කට ප්‍රදානය කරන ලද රුපියල් දශලක්ෂ 241 සමග සැසඳීමේදී, 1995 වර්ෂයේදී නිවාස ණයලාභීන් 948 කට රුපියල් දශලක්ෂ 239 ක් ප්‍රදානය කරන ලදී.

## නාගරික සංවර්ධනය

පෞද්ගලික අංශයේ ආර්ථික වර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන නාගරික යටිතල පහසුකම් සහ ඊට සම්බන්ධ සේවාවන් පුළුල් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (නා.සං.අ.) විසින් 1995 දි රුපියල් දශලක්ෂ 551 ක් වැය කරන ලදී. පසුගිය වසර සමඟ සසඳ බලනවිට 1995 දී නාගරික සංවර්ධන අධිකාරිය මගින් කරන ලද ආයෝජනයන් සියයට 48 කින් පහත වැටිණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බත්තරමුල්ල පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ප්‍රධාන වැඩ කටයුතු සම්පූර්ණ කිරීමය. නාගරික යටිතල පහසුකම් පුළුල් කිරීමේ නියැළුනු ප්‍රධානම ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙහි කටයුතු ප්‍රධාන ව්‍යාපෘති 6 ක් යටතේ එනම් පරිපාලන ව්‍යාපෘති, ඒකාබද්ධ ව්‍යාපෘති, ඉඩම් බැංකුව, අනුග්‍රාහකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘති, නගර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සහ වෙළඳ සංකීර්ණ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කෙරිණි.

නගර සංවර්ධනය සඳහා වැය කරන ලද මුළු ආයෝජනයෙන් සියයට 58 ක් හෙවත් රුපියල් දශලක්ෂ 321 ක් සමන්විත වූයේ අනුග්‍රාහකයන් වෙනුවෙන් භාරගත් ව්‍යාපෘති වලින්ය. මෙයින් සියයට 66 ක්ම (රුපියල් දශලක්ෂ 212) වැය කර ඇත්තේ ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලැබූ නගර සංවර්ධන ව්‍යාපෘතීන් සඳහාය. මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනුයේ දේශීය සහ විදේශීය ආයෝජකයන් ආකර්ශණය කරගත හැකි සහ ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථාන බවට පත් කිරීමට හැකිවන අයුරින් තෝරාගත් නගර වලට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සපයා ඒවා ද්විතියික නගර බවට සංවර්ධනය කිරීමය. විමසුමට ලක් වන වර්ෂය තුලදි ගාලු මුවදොර පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ මාදිවල නිවාස සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් දශලක්ෂ 20 බැගින් වැය කෙරිණි. බත්තරමුල්ල පරිපාලන සංකීර්ණය ඉදි කිරීම සඳහා රුපියල් දශලක්ෂ 177 ක් වැය කෙරිණි. වෙළඳ සංකීර්ණ ඉදිකිරීම, නගර සංවර්ධන ව්‍යාපෘති සහ ඒකාබද්ධ ව්‍යාපෘති සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් රුපියල් දශලක්ෂ 29 ක් වැය කළේය. තවද ඌන සංවර්ධිත හෝ භාවිතයට නොගත් ඉඩම් මිලදී ගැනීම සඳහා ඉඩම් බැංකුව මගින් රුපියල් දශලක්ෂ 22 ක් වැය කළේය.

නාගරික යටිතල ව්‍යුහය ගොඩ නැගීම සඳහා වූ මෙම ප්‍රයත්නයන් මධ්‍යයේ වුවද නාගරික ප්‍රදේශ තුල සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක බව සහ ප්‍රමාණවත් බව පිළිබඳ ගැටළු පැනනැගී ඇත. ප්‍රමාණවත් ලෙසින් සේවාවන් සැපයීමේ ශක්‍යතාවය පුළුල් කිරීම පිණිස එයට වග කිවයුතු ආයතන අපොහොසත් වීමෙන්, වැසි ජලය බැස යාම, ජල ගැලීම් හා ජලගැලීම් මට්ටම් සහ අපද්‍රව්‍ය බැහැර කිරීම ආදිය පිළිබඳ වූ බරපතල ප්‍රශ්න පැන නැගී ඇත. එමගින් අනාගත නාගරික කේන්ද්‍රයන් සංවර්ධනයේදී වඩාත් කාර්යක්ෂම සහ ක්‍රමවත් සැලසුම් උපාය මාර්ගයන්ගේ අවශ්‍යතාව මනාව අවධාරණය කරයි.

සංඛ්‍යා සටහන 5.13

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල - දිස්ත්‍රික්ක අනුව වියදම 1994-1995

රුපියල් දශලක්ෂ

| දිස්ත්‍රික්කය / ව්‍යාපෘතිය (අ) | විදේශාධාර මූලාශ්‍රය | ඇස්තමේන්තු කරන ලද ආයෝජන වියදම | | | සමුච්චිත වියදම | | සමුච්චිත වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | 1994 වර්ෂය අවසානය දක්වා (ආ) | 1995 වර්ෂය අවසානය දක්වා (ඇ) | 1994 වසර තුළදී (ආ) | 1995 වසර තුළදී (ඇ) |
| 1. මාතර (1979) | සීඩා | 598.65 | 72.94 | 671.59 | 497.29 | 529.05 | 57.27 | 31.76 |
| 2. හම්බන්තොට )1979) | නොරාඩ් | 1,330.00 | 50.00 | 1,380.00 | 893.99 | 967.79 | 60.53 | 73.80 |
| 3. නුවරඑළිය (1979) | නෙදර්ලන්තය | 826.00 | 26.00 | 852.00 | 524.30 | 575.41 | 43.90 | 51.11 |
| 4. බදුල්ල (1981) | ඉෆාර්ඩ් / සීඩා | 1,116.00 | 297.00 | 1,413.00 | 577.23 | 621.72 | 49.28 | 44.49 |
| 5 රත්නපුර (1984) | නෙදර්ලන්තය | 627.00 | 64.00 | 691.00 | 308.68 | 350.47 | 27.10 | 41.79 |
| 6. මොනරාගල (1984) | නොරාඩ් | 1,156.00 | 57.00 | 1,213.00 | 511.45 | 596.87 | 67.98 | 85.42 |
| 7. කෑගල්ල (1986) | ඉෆාඩ් | 408.00 | 228.00 | 636.00 | 494.77 | 577.85 | 94.42 | 83.08 |
| 8. කළුතර (1987) | ෆිනිඩා | 397.00 | 120.00 | 517.00 | 414.89 | 469.01 | 9.91 | 54.12 |
| 9. මහනුවර (1987) | ජර්මනිය | 436.00 | 35.00 | 471.00 | 104.37 | 128.57 | 26.90 | 24.20 |
| 10. ගම්පහ (1989) | ජපානය | 1,971.00 | 204.00 | 2,175.00 | 552.35 | 1,494.85 | 10.14 | 942.50 |
| 11. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1991) | ආ.සං.බැං. | 1,920.00 | 480.00 | 2,400.00 | 303.08 | 542.81 | 191.06 | 239.73 |
| 12 අනුරාධපුරය (1992) | සීඩා | 804.00 | 141.80 | 945.80 | 64.50 | 82.06 | 34.36 | 17.56 |
| 13. ඒකාබද්ධ ප්‍රාථමික සේවා ව්‍යාපෘතිය පුත්තලම් (1992) | යුනිසෙෆ් | 106.00 | 52.50 | 158.50 | 67.32 | 90.00 | 21.29 | 22.68 |
| 14. වියළි කලාපීය සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘතිය (1993) | කෘ.ෂි.සං.ජා.අ / ජර්මනිය | 578.00 | 285.83 | 863.83 | 80.45 | 128.94 | 51.17 | 48.49 |
| 15. වාරිමාර්ග සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (1994) | යුරෝපීය ප්‍රජාවගේ කොමිෂම | 347.91 | 74.09 | 422.00 | 9.02 | 14.72 | 9.02 | 5.70 |
| එකතුව | | 12,621.56 | 2,188.16 | 14,809.72 | 5,403.69 | 7,170.12 | 754.33 | 1,766.43 |

(අ) ක්‍රියාත්මක කරණ ලද වර්ෂය වරහන් තුළ දැක්වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය : මුදල් , ක්‍රම සම්පාදන, ජනවාර්ග කටයුතු සහ ජාතික ඒකාබද්ධ කිරීමේ අමාත්‍යාංශය

## ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව

ජලසම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාප්තිය හා වර්ධනය පිළිබඳ කටයුතු ප්‍රධාන වශයෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ස.ජ.ම.) යටතේ පවතී. ජා.ජ.ස.ජ.ම. මගින් සපයනු ලැබූ ජල සන්ධිකිරීම් සංඛ්‍යාව 1995 දී 28,680 දක්වා සියයට 10 කින් වර්ධනය විය. වර්ෂය තුළදී නාගරික අංශය සඳහා සපයනු ලැබූ ජලසම්පාදන පහසුකම් සියයට 10 කින් වර්ධනය වූ අතර ග්‍රාමීය අංශයේ පහසුකම් සියයට 11 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නල ජල සැපයුම් ප්‍රමාණය 1994 දි ඝන මීටර් දශලක්ෂ 249 සිට 1995 දී ඝන මීටර් දශලක්ෂ 273 දක්වා සියයට 10 කින් ඉහළ ගියේය. ජා.ජ.ස.ජ.ම. ට අනුව 1995 වර්ෂය අවසන් වන විට සමස්තයක් ලෙස මුළු රටෙහි නාගරික ජන සංඛ්‍යාවෙන් සියයට 89 ක්ද, ග්‍රාමීය ජන සංඛ්‍යාවෙන් සියයට 57 ක්ද පිරිසිදු පානීය ජල පහසුකම් (නල ජලය, ආරක්ෂණ ළිං සහ නල ළිං) ලබා සිටියහ. ග්‍රාමීය අංශයේ ජලසම්පාදන පහසුකම් තවදුරටත් පුළුල් කළයුතු බව මෙයින් අවධාරණය කෙරේ.

අවම වශයෙන් පිරිවැය ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම යටතේ, ජලසම්පාදන සේවාවන් කාර්යක්ෂම ලෙස බෙදා හැරීම පවත්නා ජල සම්පාදන ප්‍රතිපත්තිය වේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රධාන උපාය මාර්ගයන් සහ ආයතනික ප්‍රතිසංස්කරණයන් වනුයේ කාර්යක්ෂම මූල්‍ය පාලනය සහ පුළුල් මහජන සහභාගිත්වයයි. 1995 වර්ෂයේදී ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන්හි මුළු ආයෝජනය රුපියල් බිලියන 4 ක් විය. ජලසම්පාදන යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සම්පත් වලින් දළ වශයෙන් සියයට 60 ක්ම ලැබී ඇත්තේ ජා.සං.සං. (IDA) ආ.සං.බැ. (ADB) ආ.ජා.ආ.ස.අ. (OECF) සහ ආ.ජා.සං.ස. (ODA) වැනි විදේශීය මූලාශ්‍ර වලිනි. විදේශ ආධාර මගින් පවත්වාගෙන යනු ලැබූ ප්‍රධාන ජලසම්පාදන ව්‍යාපෘති නම්, නැගෙනහිර කොළඹ සඳහා ජලසම්පාදන ව්‍යාපෘතිය, මාතර ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය, කොළඹ දකුණ ව්‍යාපෘතිය සහ උඩුනුවර-යටිනුවර ව්‍යාපෘතිය යනාදියයි.

ග්‍රාමීය අංශයේ ජලසම්පාදන සේවාවන්හි ව්‍යාප්තිය සඳහා ඉහළ ප්‍රමුඛතාවක් දක්වන ලදී. මහජන සහභාගිත්වයෙන් යුතුව ග්‍රාමීය ප්‍රදේශවල ජලසම්පාදනය පුළුල් කිරීමේ අරමුණින් ජා.සං.සං. මගින් අරමුදල් සපයන ලද මහජන ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබිණ. මෙම ව්‍යාපෘතිය ප්‍රථමයෙන්ම රත්නපුර, බදුල්ල හා මාතර දි ක්‍රියාත්මක කෙරිණි. මෙම ව්‍යාපෘතිය යටතේ වර්ෂය තුළදි ග්‍රාමීය ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති 219 ක්ද, පාසල් ජලසම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම 407 ක් සහ කුඩා නගර ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතීන් 17 ක් ද ක්‍රියාත්මක කරන ලදී

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 1979 දී ආරම්භ කෙරිණි. මෙම වැඩසටහන මගින් ග්‍රාමීය ජනතාවගේ සාමාන්‍ය ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස ආර්ථික ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමද, තුලනාත්මක වර්ධනයක් ඇති කිරීම තුලින් දිස්ත්‍රික්ක තුල විෂමතා අඩුකිරීමද, විශේෂයෙන් ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට ගැලපෙන සේ ප්‍රාදේශීය මූලිකත්වයන් දිරි ගන්වන අයුරින් සංවර්ධන ප්‍රයත්නයන්ට යොමු කිරීමද අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනට විදේශ රටවල් සහ විදේශ ආයතන මගින් අරමුදල් සැපයිනි.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට 1995 අවසාන වනවිට දිස්ත්‍රික්ක 14 ක් ආවරණය වන ව්‍යාපෘති 15 ක් විය. වර්ෂය තුලදී අනුරාධපුර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි පළමු අදියරද හා මාතර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි හතරවන අදියරය ද අවසන් කෙරිණි. අනුරාධපුර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි දෙවන අදියර හා මාතර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ සටහනෙහි පස්වන අදියර ද 1995 ජූලි මාසයේදී ඇරඹිණි. 1995 වර්ෂයේදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මගින් රුපියල් දශලක්ෂ 1,766 ක් භාවිතා කරන ලදී. එය පසුගිය වසරේ මුළු පිරිවැය සමග සසඳන විට රුපියල් බිලියනයකටත් වඩා ඉහළයාමකි. මෙම තියුණු ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ වර්ෂය තුළ ගම්පහ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් දශලක්ෂ 943 ක් සහ දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් දශලක්ෂ 240 ක් වැය කිරීමයි. මුදල්, සැලසුම්, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට අනුව මෙම වැඩසටහන මගින් ඒ සඳහා ඇස්තමේන්තු කළ මුදලින් සියයට 90 ක්ම වැය කර තිබුණි.

## සමෘද්ධි වැඩසටහන

දිළිඳුකම පිටුදැකීමේ රජයේ ප්‍රධාන වැඩසටහන වූ සමෘද්ධි වැඩසටහන 1995 ජූනි මසදී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනෙහි මූලික සංකල්පය වනුයේ පවුල් ඒකකයෙන් ආරම්භ කර ජාතික මට්ටමින් දිළිඳුකම පිටුදැකීමයි. රටෙහි දිළිඳුතම කොටස්වල තත්ත්වය යහපත් අතට හැරවීම, යෝග්‍ය මැදිහත්වීම් මගින් ග්‍රාමීය නිෂ්පාදන පදනම ශක්තිමත් කිරීම, මානව සම්පත් සංවර්ධනය සහ මෙතෙක් පවත්නා බැංකු ක්‍රමයෙන් ප්‍රතිලාභ නොලැබූ ග්‍රාමීය ප්‍රජාවගේ සහාය පිණිස විකල්ප බැංකු ක්‍රියාවලියක් දියුණු කිරීම මේ සඳහා ගනු ලබන ප්‍රධාන ක්‍රියාමාර්ග වේ.

සමෘද්ධි වැඩසටහන මගින් පහළම ආදායම් මට්ටමේ සිටිතැයි සලකනු ලබන පවුල් දශලක්ෂ 1.2 ක් ආවරණය කිරීමට අපේක්ෂා කෙරුණි. ඒ අනුව, 1995 වර්ෂය අවසාන වනවිට, වැඩසටහන යටතේ පවුල් 12,13,535 ක් ප්‍රතිලාභ ලබා ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ ගැනෙන මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 67 කට සමාන සහන ලැබිය යුතුම දිළිඳු පවුල්වල මාසික ආදායම රුපියල් 1,500 වන සේ මට්ටම් දෙකකදී (රුපියල් 1,000 සහ රුපියල් 500 බැගින්) ආදායම් පරිපූරකයන් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන මගින් එක් පුද්ගලයකු හෝ දෙදෙනෙකුගෙන් සමන්විත පවුල් සඳහා මසකට රුපියල් 100 සහ රුපියල් 200 බැගින් ද සපයන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ මාස 6 ක කාලයක් තුළ ඒ සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් දශලක්ෂ 2,551 ක් විය. තමන් ලබාගත් ආදායම් සහනයෙන් කොටසක් ඉතිරිකිරීම සඳහා සියලුම සමෘද්ධි ප්‍රතිලාභීන් උනන්දු කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ 1995 වසරේදී රුපියල් දශලක්ෂ 427 ක් ඉතිරි කර ඇත.

සමෘද්ධි අධිකාරී පනත 1995 දි පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරිනි. 1996 ජනවාරි මස අවසානයේදී සමෘද්ධි අධිකාරිය පිහිටු වීම අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනෙහි විධායක සහ පරිපාලන හස්තය ලෙස අධිකාරිය ක්‍රියා කරණු ඇත. ජාතික මට්ටමින් වැඩසටහනෙහි ප්‍රගතිය මෙහෙයවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන දිස්ත්‍රික් සමෘද්ධි කමිටු මගින් එහි කටයුතු මෙහෙයවනු ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට සහ ඉන් අනතුරුව අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන්ට ආධාර කිරීමට සමෘද්ධි නියාමකයින් 22,861 ක් සහ සමෘද්ධි කළමනාකරුවන් 1,196 ක්ද මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම පත්කර තිබුණි. ප්‍රදේශයෙහි ලබාගත හැකි සම්පත් මත පදනම් වූ සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකම සමෘද්ධි කාර්ය සාධක බලකායක් පත් කරණු ලැබිණ. 1995 වර්ෂය අවසානය වන විට, කාර්ය සාධක බලකායයන් 12,168 ක් පිහිටුවනු ලැබිය.

සමෘද්ධි වැඩසටහනෙහි දෙවන අදියරේදී, ග්‍රාමීය අංශයේ ආදායම් මට්ටම ඉහළ නැංවීම, රැකියා අවස්ථා පුළුල් කිරීම, ග්‍රාමීය ඉතුරුම් හා බැංකු කටයුතු වර්ධනය කිරීම සහ ග්‍රාමීය අංශයේ ආර්ථික හා සාමාජික යටිතල ව්‍යුහය වර්ධනය කිරීම ප්‍රධාන ඉලක්කයන් වනු ඇත. මෙම අරමුණු ලඟා කර ගැනීම සඳහා ප්‍රධාන සංවර්ධන වැඩසටහන් පහක් සැලසුම් කෙරිණි. ග්‍රාමීය ඉතුරුම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාපෘති (එක් කලාපයකට අඩුම වශයෙන් ව්‍යාපෘති දෙකක්වත් වන ලෙස) ස්වයංරැකියා, ව්‍යාපෘති සහ අතිරේක ආදායම් උපයනු ලබන (මහන මැෂින් සැපයීම හෝ පශු සංවර්ධන ආදි) ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ඇත. මෙම ව්‍යාපෘති සඳහා මුදල් සපයනුයේ සමෘද්ධි භාරකාර අරමුදලින් සහ වාණිජ බැංකු ආදියෙනි. ඉතිරිකිරීම්, ආයෝජන සහ ග්‍රාමීය ව්‍යවසායකත්වය සහ පුහුණුව වර්ධනය කිරීම සඳහා තවත් සංවර්ධන වැඩසටහනක් දියත් කරනු ඇත. සමෘද්ධි බැංකු පදනම සහ ග්‍රාමීය බැංකු සමාජ මෙම ව්‍යාපෘතිය යටතේ පිහිටුවනු ඇත. ග්‍රාමීය ආර්ථික සහ සමාජ යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන පෙළේ සංවර්ධන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කර ඇත. ආර්ථික යටිතල ව්‍යුහ සංවර්ධන වැඩසටහන යටතේ 1995 දී වාරිමාර්ග, ජලසම්පාදන, මාර්ග සහ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රවල කුඩා පරිමාණ සහභාගිත්ව ව්‍යාපෘති 11,306 ක් සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිණ. මේ සඳහා දරන ලද මුළු රාජ්‍ය ආයෝජනය රුපියල් දශලක්ෂ 111 කි. මෙම වැඩසටහන 1996 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. සමාජ යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ පෝෂණ ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ශ්‍රම වෙළෙඳපොල සඳහා තරුණ කොටස් සූදානම් කිරීම පිණිස රැකියා තොරතුරු මධ්‍යස්ථානයක්ද පිහිටුවීමට අපේක්ෂා කෙරේ.